11 JUN 1996

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1995 අංක 35 දරන
# මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනත

---

[සහතිකය සටහන් කළේ 1995 දෙසැම්බර් මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1995 දෙසැම්බර් මස 22 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : රු. 3.90 යි. තැපැල් ගාස්තුව : රු. 4.10 යි.

# 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනත

[සහතිකය සටහන් කළේ 1995 දෙසැම්බර් මස 21 වන දින]

එල්. ඩී.—ඕ. 50/81

පඩි සහ මිම්ම පිළිබඳ නීතිය ප්‍රතිශෝධනය කිරීම හා සංශෝධනය කිරීමද සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, මෙහි පසුව සඳහන් කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. කෙටි නාමය හා ක්‍රියාත්මක වීම.

## I වන කොටස

### මිනුම් ඒකක

2. ජාත්‍යන්තර ඒකක ක්‍රමය (SI) සහ පඩි සහ මිම්ම පිළිබඳ මහා සම්මේලනය විසින් නිශ්චය කරන ලද පරිදි වූ සහ මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති පරිදි වූ ඒවායේ ගුණාකාර ශ්‍රී ලංකාව තුළ සියලු කාර්යය සඳහා මිනුම් ඒකක විය යුතු ය : මිනුම් ඒකක.

එසේ වුව ද, අනුරූප ජාත්‍යන්තර මිනුම් ඒකක අනුව අර්ථ කථනය කරනු ලැබූ පරිදි වූ මෙහි දෙවන උපලේඛනයේ දක්වා ඇති මිනුම් ඒකක, නියමිත සේ කාලසීමා සඳහා භාවිතා කිරීමට අවසර දෙනු ලැබිය යුතු ය.

## II වන කොටස

### මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව සහ ජාතික මිනුම් පර්යේෂණාගාරය පිහිටුවීම.

3. මේ පනතේ කාර්යය සඳහා— මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව සහ ජාතික මිනුම් පර්යේෂණාගාරය පිහිටුවීම.

(අ) මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන දෙපාර්තමේන්තුවක් හෝ දෙපාර්තමේන්තු අංශයක් ; සහ

(ආ) ඒ දෙපාර්තමේන්තුව තුළ ජාතික මිනුම් පර්යේෂණාගාරය යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "පර්යේෂණාගාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) පර්යේෂණාගාරයක්

පිහිටුවනු ලැබිය යුතු ය.

අධ්‍යක්ෂ ආදී නිලධරයන් පත් කිරීම.

4. (1) මේ පනතේ කාර්යය සඳහා :—

(අ) (මෙහි මින් මතු 'අධ්‍යක්ෂවරයා' යනුවෙන් හඳුන්වනු ලබන) මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අධ්‍යක්ෂවරයා වශයෙන් තැනැත්තකු නමින් හෝ ධුරයෙන් ;

(ආ) නියෝජ්‍ය මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අධ්‍යක්ෂවරයා වශයෙන් තැනැත්තකු නමින් හෝ ධුරයෙන් ;

(ඇ) සහකාර මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අධ්‍යක්ෂවරුන් වශයෙන් අවශ්‍ය විය හැකි තැනැත්තන් සංඛ්‍යාවක් ;

(ඈ) මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අධිකාරිවරුන් වශයෙන් අවශ්‍ය විය හැකි තැනැත්තන් සංඛ්‍යාවක් ;

(ඉ) සහකාර මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අධිකාරිවරුන් වශයෙන් අවශ්‍ය විය හැකි තැනැත්තන් සංඛ්‍යාවක් ; සහ

(ඊ) මේ පනතේ පතිපාදන ක්‍රියාත්මක කිරීමේ සහ විධිවිධාන බලපැවැත්වීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සංඛ්‍යාවක්

පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතින් හෝ මේ පනත යටතේ අධ්‍යක්ෂවරයාට පවරනු ලැබූ, නියම කරනු ලැබූ හෝ වෙන් කර දෙනු ලැබූ බලතල, කාර්ය හෝ කර්තව්‍ය සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද නියෝජ්‍ය මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අධ්‍යක්ෂවරයා විසින් අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව ක්‍රියාත්මක කළ හැකි ය; නැතහොත් ඉටු කළ හැකි ය.

(3) මේ පනතින් හෝ මේ පනත යටතේ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අධිකාරිවරුන්ට පවරනු ලැබූ, නියම කරනු ලැබූ හෝ වෙන් කර දෙනු ලැබූ බලතල, කාර්ය හෝ කර්තව්‍ය සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ පත් කරන ලද සහකාර මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අධිකාරිවරුන් විසින් මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අධිකාරිවරුන්ගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව ක්‍රියාත්මක කළ හැකි ය; නැතහොත් ඉටු කළ හැකි ය.

## III වන කොටස

### මිනුම් ඒකක පිළිබඳ ප්‍රමිති

ශ්‍රී ලංකා ප්‍රමිති.

5. (1) මේ පනතෙහි කාර්යය සඳහා අවශ්‍ය යයි සලකන මිනුම් ඒකක පිළිබඳ ප්‍රමිති, අමාත්‍යවරයා විසින් කලින් කල ලබා ගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලබා ගන්නා ලද යම් මිනුම් ඒකකයක් පිළිබඳ සෑම ප්‍රමිතියක්ම මෙහි පළමුවන උපලේඛනයෙහි අර්ථකථනය කරනු ලබන පරිදි වූ මිනුම් ඒකකයක සමකයක් හෝ එවැනි යම් මිනුම් ඒකකයක ගුණාකාරය හෝ උපගුණාකාරය විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ලබාගන්නා ලද යම් මිනුම් ඒකකයක් පිළිබඳ සෑම ප්‍රමිතියකම විස්තරයක් අධ්‍යක්ෂවරයාගේ විධානයක් මත ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ලබා ගන්නා ලද යම් මිනුම් ඒකකයක් පිළිබඳ සෑම ප්‍රමිතියක්ම ශ්‍රී ලංකාවේදී භාවිතයට ගැනීමට පෙර ජාත්‍යන්තර පඩි හා මිමි කාර්යාංශයේ පර්යේෂණාගාරය හෝ වෙනත් රටක වෙනත් යම් ජාතික පර්යේෂණාගාරයක දී අංක ශෝධනය කර සහතික කළ යුතු ය; නැතහොත් සම්මත ක්‍රමයකින් අංක ශෝධනය කළ යුතු ය:

එසේ වුව ද, යම් ප්‍රමිතියක් හෝ උපකරණයක් එහි ස්වභාවය නිසාම මූලික ප්‍රමිතියක් වන්නේ ද එම ප්‍රමිතිය හෝ උපකරණය සම්බන්ධයෙන් එවැනි අංක ශෝධනයක් අවශ්‍ය නොවිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ ලබාගෙන පළ කරන ලද යම් මිනුම් ඒකකයක් පිළිබඳ ප්‍රමිතියක් ශ්‍රී ලංකාවේ භාවිතයට ගත යුතු බව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයකින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කළ හැකි අතර, එසේ පළ කරනු ලැබූ විට ඒ ප්‍රමිතිය ශ්‍රී ලංකා ප්‍රමිතියක් විය යුතු ය. තවද, සියලු කාර්ය සඳහා එය සත්‍ය හා නිවැරදි බව සැලකිය යුතු ය.

ශ්‍රී ලංකා ප්‍රමිති අධ්‍යක්ෂවරයාගේ ආරක්ෂාභාරයේ තිබිය යුතු බව.

6. (1) පර්යේෂණාගාරය අධ්‍යක්ෂවරයාගේ පාලනය යටතේ පැවතිය යුතුය. තව ද පර්යේෂණාගාරය විසින් ශ්‍රී ලංකා ප්‍රමිති පවත්වා ගෙන යාමත් ඒ ප්‍රමිතිවල අගය වෙනත් යම් පර්යේෂණාගාරයකට හෝ ආයතනයකට දැනුම්දීමත්, මේ කාර්යයන්ට අදාළ පර්යේෂණ පැවැත්වීමත් කරනු ලැබිය යුතු ය.

(2) සෑම ශ්‍රී ලංකා ප්‍රමිතියක්ම තත් කාර්යය සඳහා නියම කරනු ලබන ආකාරයෙන්ම අධ්‍යක්ෂවරයාගේ ආරක්ෂා භාරය යටතේ පර්යේෂණාගාරයේ තබා ආරක්ෂා කරනු ලැබිය යුතු ය.

(3) නැවත අංක ශෝධනය කිරීම අවශ්‍ය වන යම් ශ්‍රී ලංකා ප්‍රමිතියක් සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් යටත් පිරිසෙයින් සෑම දස වර්ෂයකටම වරක් ඒ ප්‍රමිතිය නැවත අංක ශෝධනය කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

එසේ වුව ද, යම් මිනුම් ඒකකයක් පිළිබඳව යම් ශ්‍රී ලංකා ප්‍රමිතියක් ඒ කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත යවනු ලැබීමට ඇති අවස්ථාවක එම මිනුම් ඒකකය පිළිබඳ ආශ්‍රය ප්‍රමිතියක් ඒ ශ්‍රී ලංකා ප්‍රමිතිය සමග සැසඳීමෙන් සත්‍යායනය කරනු ලැබීමට හෝ සම්මත ක්‍රමයකින් අංක ශෝධනය කරනු ලැබීමට සහ සහතික කරනු ලැබීමට එය අධ්‍යක්ෂවරයාගේ ආරක්ෂා භාරය යටතේ තැබීමටත් අමාත්‍යවරයා විසින් සැලැස්විය හැකි අතර, ශ්‍රී ලංකා ප්‍රමිතිය ශ්‍රී ලංකාවෙන් පිටත තිබෙන කාලය තුළ ඒ ආශ්‍රය ප්‍රමිතිය ශ්‍රී ලංකා ප්‍රමිතියක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ආශ්‍රය ප්‍රමිති.

7. (1) අමාත්‍යවරයා විසින් මේ පනතේ කාර්යය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති වලින් ව්‍යුත්පන්න ආශ්‍රය ප්‍රමිති යනුවෙන් ඥාපනය කරනු ලබන එවැනි ප්‍රමිති ලබාගෙන ඒ ප්‍රමිති අධ්‍යක්ෂවරයාගේ ආරක්ෂා භාරයේ තැබිය යුතු ය. ඒ සෑම ආශ්‍රය ප්‍රමිතියක්ම ශ්‍රී ලංකා ප්‍රමිතියක් සමග සැසඳීමෙන් හෝ නිශ්චිත ප්‍රමිති පර්යේෂණාගාරයක දී සම්මත ක්‍රමයකින් හෝ අංක ශෝධනය කරනු ලැබිය යුතු ය.

(2) සෑම ආශ්‍රය ප්‍රමිතියක්ම ප්‍රථම අංක ශෝධනයෙන් පසු යටත් පිරිසෙයින් සෑම පස් අවුරුද්දකටම වරක්ම අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු ලබන විධානයක් මත පර්යේෂණාගාරයේ දී අංක ශෝධනය කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ලබාගත් යම් මිනුම් ඒකකයක ආශ්‍රය ප්‍රමිතියක් ශ්‍රී ලංකාව තුළ භාවිතයට ගත යුතු බව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය. තවද, ප්‍රතිවිරුද්ධ තත්ත්වය ඔප්පු කරනු ලබන තුරු ඒ ආශ්‍රය ප්‍රමිතිය සත්‍ය හා නිවැරදි ලෙස සැලකිය යුතු ය.

ද්විතීයික ප්‍රමිති

8. (1) ශ්‍රී ලංකා ප්‍රමිතිවලින් සහ ආශ්‍රය ප්‍රමිතිවලින් ව්‍යුත්පන්න වෙනත් ද්විතීයික හා තෘතීයික ප්‍රමිති මේ පනතේ කාර්යය සඳහා අවශ්‍ය පරිදි අධ්‍යක්ෂවරයා විසින් කලින් කල ලබා ගත හැකි ය.

(2) අධ්‍යක්ෂවරයා විසින් එවැනි සෑම ද්විතීයික හෝ තෘතීයික ප්‍රමිතියක්ම සත්‍යායනය කරනු ලැබීමට හෝ අංක ශෝධනය කරනු ලැබීමට ද නිවැරදි බවට සහතික කරනු ලැබීමට හෝ සහතික කරනු ලැබීමට ද සැලැස්විය යුතු ය. එසේ නිවැරදි බවට සහතික කරන ලද හෝ සහතික කරන ලද සෑම ප්‍රමිතියක්ම, ප්‍රතිවිරුද්ධ තත්ත්වය ඔප්පු කරනු ලබන තුරු, සත්‍ය හා නිවැරදි ලෙස සැලකිය යුතු ය.

(3) සෑම ද්විතියික හෝ තෘතියික ප්‍රමිතියක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් අධ්‍යක්ෂවරයා විසින් නිර්ණය කරනු ලබන කාලපරිච්ඡේද ඇතුළත සත්‍යායනය හෝ අංක ශෝධනය කරනු ලැබිය යුතු ය.

ගොන්න ප්‍රමාණවල මිනුම්.

9. ශ්‍රී ලංකා ප්‍රමිතියක්, ආශ්‍රෙය ප්‍රමිතියක් හෝ ද්විතීයික හෝ තෘතියික ප්‍රමිතියක් පිහිටුවනු ලැබ ඇත්තේ යම් මිනුම් ඒකකයක් සඳහා ද ඒ මිනුම් ඒකකය මත කෙලින්ම හෝ අන්‍යාකාරයකින් පදනම් වී ඇති සියලු ගොන්න ප්‍රමාණ මිනුම් එවැනි යම් ප්‍රමිතියකට යොමු කළ හැකි විය යුතු ය.

අංක ශෝධිත සහතිකය.

10. අංක ශෝධනයක් හෝ පරීක්ෂාවක් කිරීමට මේ පනතින් බලය දෙනු ලබන හෝ අංක ශෝධනයක් හෝ පරීක්ෂාවක් කිරීමට අධ්‍යක්ෂවරයා විසින් විධාන කරනු ලබන සෑම තැනැත්තකුම නිශ්චිත ආකෘතියක් වූ ද, ඔහු විසින් අත්සන් කරනු ලැබූ ද අංක ශෝධිත සහතිකයක් නිකුත් කළ යුතු ය.

ප්‍රමිති පිළිබඳ අධිකරණ පිළිගැනීම.

11. අධිකරණයක් විසින්—

(අ) සෑම ශ්‍රී ලංකා ප්‍රමිතියක්, ආශ්‍රෙය ප්‍රමිතියක්, ද්විතියික හෝ තෘතීයික ප්‍රමිතියක් පිළිබඳව ;

(ආ) 10 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම අංක ශෝධිත සහතිකයක් පිළිබඳව

අධිකරණ පිළිගැනීම කළ යුතු ය.

## IV වන කොටස

## වෙළෙඳ කටයුතු සඳහා මිනුම්

සියලු මිනුම්, විකිණීම යනාදිය සහ ගාස්තු හෝ තීරු බදු එකතු කිරීම අනුමත මිනුම් ඒකක අනුව විය යුතු බව.

12. (1) 34 වන වගන්තියෙහි අන්‍යාකාර විධිවිධාන සලසා ඇති පරිදි හැර, ශ්‍රී ලංකාවෙහි ඇති කරනු හෝ සිදු කරනු ලබන්නා වූ ද යම් ගිවිසුමක්, වාසි හුවමාරුවක්, විකිණීමක් හෝ ගනුදෙනුවක් මගින් වූ යම් වැඩක්, භාණ්ඩ, ද්‍රව්‍ය, වෙළෙඳ බඩු හෝ වෙනත් දේවල් කිරීම, විකිණීම, බාරදීම, ගෙනයෑම, මැනීම, ආගණනය කිරීම, ඒවාට ගෙවීම හෝ එකතුවීම මිනුම් ඒකකයක් අනුව කෙරේ ද, එවැනි සෑම ගිවිසුමක්, වාසි හුවමාරුවක්, විකිණීමක් හෝ ගනුදෙනුවක්ම තුන්වන උපවගන්තියෙහි I වන කොටසෙහි සඳහන් මිනුම් ඒකක අතුරින් යම් ඒකකයකට අනුව ඇති කරනු ලැබිය යුතු හෝ සිදු කරනු ලැබිය යුතු වන්නේ ය.

(2) යම් මිනුම් ඒකකයකට අනුව ශ්‍රී ලංකාවෙහි අය කරනු ලබන හෝ එකතු කරනු ලබන සියලු ගාස්තු සහ තීරු බදු තුන්වන උපලේඛනයෙහි I වන කොටසෙහි සඳහන් මිනුම් ඒකක අතුරින් යම් ඒකකයකට අනුව අයකිරීම සහ එකතු කිරීම කළ යුතු ය.

(3) විකිණීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙහි යම් භාණ්ඩයක් භාජනයක ඇසුරුම් කිරීම, තුන්වන උපලේඛනයෙහි I වන කොටසෙහි දැක්වෙන අනුමත මිනුම් ඒකකවලින් යම් කියිවකට අනුව කළ යුතු ය.

(4) (1) වන උපවගන්තියෙහි විධිවිධානවලට අනුව ඇති නොකරන ලද හෝ සිදු නොකරන ලද සෑම ගිවිසුමක්, වාසි හුවමාරුවක්, විකිණීමක් හෝ ගනුදෙනුවක් ම බලරහිත වන්නේ ය:

එසේ වුව ද, එවැනි යම් ගිවිසුමකින්, වාසිහුවමාරුවකින්, විකිණීමකින් හෝ ගනුදෙනුවකින් හෝ එවැන්නක් යටතේ යම් තැනැත්තකු විසින් වාසියක් සලසාගෙන හෝ ලබා ගෙන තිබෙන අවස්ථාවක, ඒ වාසිය සලසා ගනු ලැබුවේ හෝ ලබා ගන්නා ලද්දේ යම් තැනැත්තකුගෙන් ද නැතහොත් යම් තැනැත්තකුගේ ක්‍රියාවක් හේතු කොටගෙන ද එම තැනැත්තාට වන්දි සැලසීමේ කාර්ය සඳහා අධිකරණය විසින් සුදුසු යැයි සලකනු ලබන ආඥාවක්, මේ වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද, අධිකරණය විසින් කළ හැකි ය.

තුන් වන උප ලේඛනයේ II වන කොටසේ සඳහන් පඩි හා මිම් අනුමත පඩි හා අනුමිත මිම් වශයෙන් ප්‍රකාශ කිරීම.

13. මෙහි තුන්වන උපලේඛනයේ II වන කොටසේ සඳහන් සියලු පඩි හා මිම් පිළිවෙලින් අනුමත පඩි හා අනුමත මිම් වන බව මෙයින් ප්‍රකාශ කරනු ලබන අතර, අනුමත පඩි හා අනුමත මිම් යනුවෙන් මේ පනතෙහි සඳහන් කරන ලැබේ; තවද තුන්වන උපලේඛනයේ II වන කොටසේ සඳහන් සෑම පඩි හා මිම් සංඥාවක අගයක් ම අනුමත පඩි හෝ මිම් සංඥවක අගයක් වශයෙන් මෙයින් ප්‍රකාශ කරනු ලබන අතර, අනුමත පඩි හෝ මිම් සංඥවක අගයක් යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලැබේ.

පරීක්ෂක වරුන් පත් කිරීම.

14. (1) මේ පනත පරිපාලනය සඳහා අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා විසින් සලකනු ලබන (මෙහි මින් මතු "පරීක්ෂකවරුන්" යනුවෙන් සඳහන් කරනු ලබන) මිණුම් සේවා හා උපක්‍රම පරීක්ෂකවරුන් සහ වෙනත් නිලධරයන් සංඛ්‍යාවක් අධ්‍යක්ෂවරයා විසින් පත් කළ යුතු ය.

(2) මේ පනතින් හෝ ඒ යටතේ පරීක්ෂකවරයකු වෙත පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු වූ ද නියම කරනු ලැබූ කාර්යය ඉටු කරනු ලැබිය යුතු වූ ද (මෙහි මින් මතු "කොට්ඨාසය" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රදේශයක්, ඒ සෑම පරීක්ෂකවරයකුට ම අධ්‍යක්ෂවරයා විසින් වෙන් කර දිය යුතු ය.

(3) කිසිම තැනැත්තකු, ඔහු පරීක්ෂකවරයකු වීමට අවශ්‍ය ප්‍රවීණතාව දරන බවට නියමිත ආකෘතියෙහි වූ ද අධ්‍යක්ෂවරයාගේ අත්සන සහිත වූ ද සහතිකයක් දරන්නේ නම් මිස, මේ වගන්තිය යටතේ පරීක්ෂකවරයකු වශයෙන් පත් කරනු නොලැබිය යුතු ය. කිසිම තැනැත්තකුට, අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වන පරිදි නියමිත පරීක්ෂණවලින් සමත් වුවහොත් මිස, එවැනි සහතිකයක් නිකුත් නොකරනු ලැබිය යුතු ය.

**15.** 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂකවරයන්ගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා සලකන තෘතිසික ප්‍රමිති සංඛ්‍යාවක් ඔහු විසින් සපයනු ලැබිය යුතු ය. ඒ ප්‍රමිති එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ ලේකම් කාර්යාලයෙහි තැබිය යුතු ය.

තෘතිසික ප්‍රමිති.

**16.** කිසිම තැනැත්තකු විසින්—

(අ) පඩිය මුදුනේ හෝ පැත්තේ සංඥාවක අගය පැහැදිලි ඉලක්කම්වලින් සහ අකුරුවලින් ලකුණු කර ඇත් නම් මිස, මෙහි තුන්වන උපලේඛනයේ II වන කොටසේ සඳහන් සංඥුවක අගයකට සමාන සංඥුවක අගයක් ඇතැයි අදහස් වන යම් පඩියක් ; හෝ

(ආ) පරිමාව පිළිබඳ මිම්මක් සම්බන්ධයෙන් වන විට, පිට පැත්තේ ද දිග පිළිබඳ මිම්මක් සම්බන්ධයෙන් වන විට ඉදිරි මුනතේ ද පැහැදිලි ඉලක්කම්වලින් සහ අකුරුවලින් සංඥාවක අගය ලකුණු කර ඇත් නම් මිස, මෙහි තුන්වන උපලේඛනයේ II වන කොටසේ සඳහන් සංඥුවක අගයකට සමාන සංඥුවක අගයක් ඇතැයි අදහස් වන පරිමාව හෝ දිග පිළිබඳ යම් මිම්මක් හෝ

යම් වෙළෙඳාමක කාර්යය සඳහා භාවිත කිරීම හෝ යම් වෙළෙඳාමක දී භාවිත කිරීම සඳහා තමාගේ සන්තකයේ තබා ගැනීම හෝ නො කළ යුතු ය :

එසේ වුවද යම් පඩියක ප්‍රමාණයේ කුඩා බව නිසා එම පඩියෙහි සංඥුවක අගය ලකුණු කළ නොහැකි වන්නේ නම්, මේ වගන්තියේ කිසිවකින් එසේ ලකුණු කිරීම නියම කෙරෙතැයි නොසැලකිය යුතු ය.

සංඥාවක අගයක් ලකුණු කර ඇති යම් පඩියක් හෝ මිම්මක් භාවිත කිරීම.

**17.** (1) 8 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ තිබූ රදි බවට අවසානවරට සහතික කරනු ලැබූ දිනයේ සිට ගණන් බලනු ලැබිය යුතු 8 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කරන ලද තීරණයෙහි සඳහන් කාල පරිච්ඡේදය ඉකුත් වීමෙන් පසු සාවර වූ හෝ අවස්ථාවක කිසිම පරීක්ෂවරයකු විසින් යම් පඩියක් හෝ මිම්මක් පරීක්ෂා කිරීමේ කාර්ය සඳහා යම් තෘතිසික ප්‍රමිතියක් භාවිත නොකළ යුතු ය.

(2) කිසිම පරීක්ෂකවරයකු තමාගේ ප්‍රයෝජනය සඳහා සපයනු ලැබූ යම් කිරන හෝ මනින උපකරණයක් නියමිත ආකාරයකට සත්‍යාපනය කරනු ලැබ ඇත් නම් මිස, මේ පනතේ කාර්ය සඳහා එය භාවිත නොකළ යුතු ය.

නිශ්චිත කාල පරිච්ඡේදය ඉකුත් වීමෙන් පසු තෘතිසික ප්‍රමිති භාවිත කිරීම සහ සත්‍යාපනය නොකරන ලද උපකරණ භාවිත කිරීම.

**18.** කිසිම පරීක්ෂකවරයකු පඩි හෝ මිම් තැනතොත් කිරන හෝ මනින උපකරණ සෑදීමෙන් හෝ විකිණීමෙන් හෝ අලුත්වැඩියා කිරීමෙන් යම් ලාභයක් නොලැබිය යුතු ය. තවද ඒවා සෑදීමෙහි හෝ විකිණීමෙහි හෝ අලුත්වැඩියා කිරීමෙහි හෝ සේවයේ නියුක්ත නොවිය යුතු ය.

පඩි සහ මිම් සෑදීමෙන් හෝ විකිණීමෙන් පරීක්ෂකවරයන් ලාභ නොලැබිය යුතු බව.

සත්‍යාපනය නොකළ පඩි ආදිය විකිණීම තහනම් කිරීම.

19. කිසිම තැනැත්තකු විසින්, පරීක්ෂකවරයකු විසින් සත්‍යාපනය කරනු ලැබ නියමිත සත්‍යාපනය කිරීමේ ලකුණු මුද්‍රා තබා නැති හෝ නියමිත ආකාරයෙන් සහතික කර නැති යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් වෙළෙඳාමේ දී භාවිත කිරීම සඳහා විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

පඩි ආදිය අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු බව.

20. (1) නියමිත දිනයේ සිට සහ ඉන් පසු, කිසිම පඩියක්, මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක්, ඒ පඩියේ, මිම්මේ හෝ කිරන හෝ මනින උපකරණයේ සැලසුම තත් කාර්යය සඳහා මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නිශ්චිත කරනු ලැබිය හැකි, පිරිවිතර සහ දෝෂ සීමා අනුව අධ්‍යක්ෂවරයා විසින් පරීක්ෂා කර අනුමත කරනු ලැබ ඇත්නම් මිස—

(අ) යම් වෙළෙඳාමක කාර්යය සඳහා භාවිත කිරීම හෝ යම් වෙළෙඳාමක දී භාවිත කිරීම සඳහා යම් තැනැත්තකුගේ සන්තකයේ තබා ගැනීම ;

(ආ) යම් වෙළෙඳාමක දී භාවිත කිරීම සඳහා නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම හෝ විකිණීම

නොකළ යුතු ය. එවැනි යම් පරීක්ෂණයක් සඳහා අය කරනු ලබන ගාස්තුව නියමිත පරිදි විය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා විසින් කලින් අනුමත කරනු ලැබ ඇති යම් පඩියක්, මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක්, දෝෂ සහිත බව පසුව කරනු ලබන පරීක්ෂණයක දී සොයාගනු ලබන අවස්ථාවක, කලින් දෙනු ලැබූ අනුමතය අවලංගු කිරීමට ද ඒ අවලංගු කිරීම පිළිබඳ ව යම් තැනැත්තකුට දැනුම් දීමට ද අධ්‍යක්ෂවරයාට බලය ඇත්තේ ය.

පඩි, උපකරණ, ආදිය විකුණන අලුත්වැඩියා කරන හෝ නිෂ්පාදනය කරන තැනැත්තන් ලියාපදිංචි විය යුතු බව.

21. (1) යම් පඩියක්, මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් විකුණන, අලුත්වැඩියා කරන හෝ නිෂ්පාදනය කරන තැනැත්තන් විකිණීමට, අලුත්වැඩියා කිරීමට හෝ නිෂ්පාදනය කිරීමට අදහස් කරන සෑම තැනැත්තකුම අධ්‍යක්ෂවරයා වෙත නම් ලියාපදිංචි කරවා ගත යුතු ය.

(2) ඒ ලියාපදිංචි කිරීම පිළිබඳ ව ගාස්තුවක් අය කරනු ලැබිය යුතු අතර එම ගාස්තුවේ ප්‍රමාණය නියමිත පරිදි විය යුතු ය.

(3) (i) මෙම උපවගන්තිය යටතේ—

(අ) යම් පඩියක්, මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් අලුත්වැඩියා කිරීම සඳහා ලියාපදිංචි කරවා ගැනීමට අදහස් කරන සෑම තැනැත්තකුම—

(i) ඔහු අලුත්වැඩියා කිරීමට අදහස් කරන පඩි, මිම් හෝ කිරන හෝ මනින උපකරණ වර්ගය අලුත්වැඩියා කිරීම පිණිස ඔහුට හෝ ඔහු

විසින් සේවයේ නියුක්ත කරනු ලබන තැනැත්තන්ට ඇති හැකියාව අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වන පරිදි දක්වාලිය යුතු ය; තවද,

(ii) ඒ අලුත්වැඩියාව නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන උපකරණ, මෙවලම් සහ වෙනත් පහසුකම් සතුව සිටිය යුතු ය.

(ආ) යම් පඩියක්, මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචි කරවා ගැනීමට අදහස් කරන සෑම තැනැත්තකුම—

(i) ඔහු නිෂ්පාදනය කිරීමට අදහස් කරන පඩි, මිම්ම් හෝ කිරන හෝ මනින උපකරණ වර්ගය නිෂ්පාදනය කිරීම පිණිස ඔහුට හෝ ඔහු විසින් සේවයේ නියුක්ත කරනු ලබන තැනැත්තන්ට ඇති හැකියාව අධ්‍යක්ෂවරයා සෑහීමට පත්වන පරිදි දක්වා ලිය යුතු ය;

(ii) ඒ පඩිය, මිම්ම හෝ කිරන හෝ මනින උපකරණය නිෂ්පාදනය කිරීම හෝ එකලස් කිරීම සඳහා අවශ්‍ය වන උපකරණ, මෙවලම් සහ වෙනත් පහසුකම් සතුව සිටිය යුතු ය; තවද,

(iii) ඔහු නිෂ්පාදනය කිරීමට අදහස් කරන පඩියේ, මිම්මේ හෝ කිරන හෝ මනින උපකරණයේ නියම කරනු ලබන චිත්‍ර සහ සැම්පල්, සැලසුම් අනුමතය සඳහා අධ්‍යක්ෂවරයාට යැවිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සෑම තැනැත්තකුම, ඔහු විසින් අලුත්වැඩියා කරන ලද හෝ නිෂ්පාදනය කරන ලද කවර හෝ පඩියක්, මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක්, අවස්ථාවෝචිත පරිදි, එම නිෂ්පාදනයෙන් හෝ අලුත්වැඩියාවෙන් පසු පරීක්ෂකවරයකු විසින් පරීක්ෂා කිරීම සහ සත්‍යායනය කිරීම හෝ අධ්‍යක්ෂවරයා විසින් අංක ශෝධනය කිරීම කරනු ලැබිය යුතු ය යන කොන්දේසියට යටත් විය යුතු ය. යම් තැනැත්තකු මේ කොන්දේසිය සපුරාලීම පැහැර හල අවස්ථාවක අධ්‍යක්ෂවරයා විසින් ඔහුගේ ලියාපදිංචිය අවලංගු කළ හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් තමාගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ තැනැත්තකු විසින්, ඒ අවලංගු කිරීමේ සිට මාසයක් ඇතුළත ඒ අවලංගු කිරීමට විරුද්ධව, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට අභියාචනය කළ හැකි ය.

පඩි හෝ මිම් හෝ කිරන හෝ මනින උපකරණ කලින් කල පරීක්ෂා කිරීම.

22. (1) එක් එක් පරීක්ෂකවරයා විසින් එක් එක් දිස්ත්‍රික්කය හෝ ප්‍රදේශය තුළ පඩි හෝ මිම් හෝ කිරන හෝ මනින උපකරණ පරීක්ෂා කොට සත්‍යායනය කළ යුතු දිනය සහ ස්ථානය ඒ ඒ දිස්ත්‍රික්කයේ හෝ ප්‍රදේශයේ අධිකාරිවරයා විසින් නියම කළ යුතු ය.

(2) පඩි හෝ මිම් හෝ කිරන හෝ මනින උපකරණ පරීක්ෂා කිරීම සහ ඒවා සත්‍යායනය කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ නියම කරන ලද දිනය සහ ස්ථානය පිළිබඳ දැනුම්දීම, දිස්ත්‍රික්කයේ අධිකාරිවරයා විසින් කළ යුත ය. එම දැනුම් දීම කළ යුතු ක්‍රමය සහ ආකාරය අධ්‍යක්ෂවරයා විසින් තීරණය කළ යුතු ය.

(3) සෑම පරීක්ෂකවරයකුම මේ වගන්තිය යටතේ නියම කරන ලද වේලාවේ දී සහ ස්ථානයේ දී, තමා ඉදිරියට පත් කරන ලද සියලු උපකරණ, එනම් පඩි හෝ මිම් හෝ කිරන හෝ මනින උපකරණ විභාග කොට තත් කාර්යය සඳහා සුදුසු යයි ඔහු අදහස් කරන තෘතියික ප්‍රමිති සහ පරීක්ෂා කිරීමේ උපකරණ මගින් සහ නියම කරනු ලබන කොන්දේසිවලට යටත් ව, එසේ නැතහොත් එවක් වත් පරීක්ෂා කරනු ලැබ ඇති සහ මේ කාර්ය සඳහා සුදුසු යයි ඔහු විසින් අදහස් කරන වෙනත් උපකරණ මගින් පරීක්ෂා කළ යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් කිසිවකින්, මේ වගන්තිය යටතේ නියම කරන ලද වේලාවක් හෝ ස්ථානයක් නොවන වේලාවක දී හෝ ස්ථානයක දී, පරීක්ෂණය සඳහා තමා වෙත ඉදිරිපත් කරනු ලබන යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් පරීක්ෂණයට භාජනය කිරීමෙන් හෝ සංසන්දනය කිරීමෙන් හෝ පරීක්ෂා කිරීමෙන් යම් පරීක්ෂකවරයකු වළක්වන ලෙස නොසැලකිය යුතු ය.

(5) පරීක්ෂණය සඳහා නියමිත ගාස්තුව ගෙවනු ලැබ ඇත්නම් මිස, කිසිම පරීක්ෂකවරයකු විසින් යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් මේ වගන්තිය යටතේ පරීක්ෂණයට භාජනය නොකළ යුතුය.

සත්‍යායනය ලකුණ මුද්‍රා තැබීම.

23. (1) යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක්, නිවැරදි බවත් මේ පනතේ විධිවිධානවලට හා ඒ යටතේ සාදන ලද නියෝගවල විධිවිධානවලට අනිකුත් සෑම අතකින් ම අනුකූල බවත් පරීක්ෂණයකින් පසු පරීක්ෂකවරයකු නිගමනය කළහොත් ඔහු ඒ පඩියෙහි මිම්මෙහි හෝ උපකරණයෙහි නියමිත ආකාරයෙන් නියමිත සත්‍යායනය ලකුණින් මෙන්ම වෙනත් නියමිත ලකුණකින් මුද්‍රා තැබිය යුතු ය. එහෙත් පඩිය හෝ මිම්ම හෝ කිරන හෝ මනින උපකරණය ප්‍රමාණයෙන් ඉතා කුඩා වන හෝ මුද්‍රා තබන ලැබිය නොහැකි ද්‍රව්‍යයකින් සාදා ඇති හෝ අවස්ථාවක පරීක්ෂකවරයකු විසින් ඒ බවට සහතිකයක් නිකුත් කළ යුතු ය.

(2) යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් නිවැරදි නොවේ නම් හෝ මේ පනතේ යම් විධිවිධානයකට හෝ අවස්ථාවෝචිත පරිදි ඒ පඩියට හෝ මිම්මට හෝ කිරන හෝ මනින උපකරණයට අදාළ යම් නියෝගයකට අනුකූල නොවේ නම් කිසිම පරීක්ෂකවරයකු විසින් සත්‍යායන ලකුණකින් එහි මුද්‍රා තබනු නොලැබිය යුතු ය.

(3) කිසිම පරීක්ෂකවරයකු විසින්, කිසිම පඩියක් හෝ මිම්මක්

(අ) බලයලත් සංඥවක අගයක් සහිත වුවහොත් මිස; සහ

(ආ) එම පඩියේ හෝ මිම්මේ තෘතීයික ප්‍රමිතියක් සමග ඔහු විසින් සංසන්දනය කිරීමෙන් පරීක්ෂා කොට ඇතොත් මිස

සත්‍යායන ලකුණින් මුද්‍රා තබනු නොලැබිය යුතු ය.

ස්ථානවලට ඇතුළුවීමට සහ පඩි ආදිය පරීක්ෂා කිරීමට පරීක්ෂකවරුන්ට ඇති බලය.

24. පරීක්ෂකවරයකු විසින්, තමාගේ කොට්ඨාසය ඇතුළත පිහිටියාවූ ද, යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් යම් වෙළෙඳාමක කාර්යය සඳහා තබා ඇත්තා වූ හෝ භාවිතයට ගනු ලැබ ඇත්තා වූ හෝ තබා ඇති බවට හෝ භාවිතා කරනු ලැබ ඇති බවට සැක කරනු ලබන්නා වූ හෝ අසුරා ඇති යම් භාණ්ඩයක් විකිණීම පිණිස තබා ඇති හෝ තබා ඇතැයි සැකකරනු ලබන්නා වූ ද, යම් කර්මාන්ත ශාලාවකට, සාප්පුවකට, ගබඩාවකට, ගුදම්කට, මඩුවකට, ඉඩමකට, ස්ථානයකට හෝ වාහනයකට කවර වූ හෝ සාධාරණ වේලාවක දී ඇතුළුව—

(අ) එහි තබා ඇති පඩි සහ මිම් සහ කිරන සහ මනින උපකරණ සියල්ලම හෝ ඉන් යමක් සෙවීම හෝ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලෙස ඒ අවස්ථාවේ ඒ ස්ථානය භාරව සිටින තැනැත්තාට නියම කිරීම;

(ආ) එහි දී සොයාගත් හෝ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලැබූ යම් පඩියක් හෝ මිම්මක් පරීක්ෂා කිරීම සහ එය ඒ පඩියේ හෝ මිම්මේ තෘතීයික ප්‍රමිතියක් සමග සංසන්දනය කිරීම;

(ඇ) එහි දී සොයාගත් හෝ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලැබූ යම් කිරන හෝ මනින උපකරණයක් පරීක්ෂණයට භාජනය කිරීම සහ පරීක්ෂා කිරීම;

(ඈ) සංසන්දනයෙන් හෝ පරීක්ෂණයෙන් පසු වැරදි හෝ ව්‍යාජ බව පෙනී යන හෝ මේ පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය වන පරිදි භාවිත කරනු ලැබ ඇති හෝ ලැබීමට ඉඩ ඇති ලෙස පරීක්ෂකවරයාට පෙනී යන යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් තහනමට ගෙන මේ පනත හෝ වෙනත් නීතියක් යටතේ වරදක් සඳහා නඩු පැවරීමේ කාර්යය සඳහා රඳවා තබා ගැනීම:

(ඉ) එයි තබා ඇති, විකිණීම සඳහා ඉදිරිපත් කර ඇති හෝ ප්‍රදර්ශනය කර ඇති යම් භාණ්ඩයක්, ඒ භාණ්ඩය සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලැබේද යන්න නිශ්චය කිරීම පිණිස සෝදිසි කිරීම සහ තීරා බැලීම හෝ සෝදිසි කිරීම සහ තීරා බැලීම ද මේ පනතේ යම් විධිවිධානයක් කඩකර ඇත්තේ හෝ කඩකර ඇතැයි සැක කරනු ලබන්නේ යම් භාණ්ඩයක් පිළිබඳව හෝ සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩය තහනමට ගෙන රඳවා තබා ගැනීම ද

කළ හැකි ය.

පරීක්ෂකවරුන් විසින් මුද්‍රා තබන ලද පඩි හෝ මිමි ආදිය ශ්‍රී ලංකාව තුළ භාවිත කිරීමට අවසර දිය යුතු බව.

25. මේ පනතේ 23 වන වගන්තිය යටතේ පරීක්ෂකවරයකු විසින් නියමිත සත්‍යතා ලකුණින් නිසි ලෙස මුද්‍රා තබන ලද යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් ව්‍යාජ හෝ වැරදි බව පසුව සොයා ගනු ලැබුවහොත් මිස, ශ්‍රී ලංකාවේ කවර කොටසක හෝ භාවිත කරනු ලැබිය හැකි ය.

අයකරනු ලබන ගාස්තු අරමුදලට බැරකළ යුතු බව.

26. මේ පනතේ විධිවිධාන යටතේ යම් මනින උපකරණයක් අංක ශෝධනය කිරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් අය කරනු ලබන සියලුම ගාස්තු අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

පරීක්ෂකවරුන් විසින් ලේඛන පවත්වාගෙන යා යුතු බව.

27. සෑම පරීක්ෂකවරයකුම මේ පනත යටතේ තම කාර්ය ඉටු කිරීම පිළිබඳව අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු ලබන විධානයක් මගින් නියම කරනු ලබන ලේඛන තබාගත යුතු අතර එම විධානයේ සඳහන් කාලවල දී පරීක්ෂණය සඳහා එම ලේඛන අධ්‍යක්ෂවරයා වෙත යැවිය යුතු ය.

පරීක්ෂකවරුන් ඇප තැබිය යුතු බව.

28. (1) පරීක්ෂකවරයකු වශයෙන් පත්වීමක් ලැබූ සෑම තැනැත්තකුම, තමා පත් කරනු ලැබීමෙන් පසු නොපමාව, තම නිලයේ කාර්යය නිසි පරිදි ඉටු කිරීම සඳහාත් මේ පනත යටතේ තමාට ලැබෙන සියලුම ගාස්තු නිසි පරිදි ගෙවීම සඳහාත්, මේ පනතේ කාර්යය සඳහා තමාට භාර දී ඇති භෞතික ප්‍රමිතිවල, මුද්‍රාවල සහ අනිකුත් උපකරණවල ආරක්ෂාව සඳහාත් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයක ඇප තැබිය යුතු ය.

(2) පරීක්ෂකවරයකු අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ පරීක්ෂකවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ තැබීමට නියමිත ඇපය රාජ්‍ය නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ තැබිය යුතු අතර ඒ ආඥාපනතේ විධිවිධාන ඒ අනුව අදාළ වන්නේ ය.

බර කිරීමක හෝ මැනීමක හරි වැරදි බැලීම සඳහා ස්ථානවලට ඇතුළුවීමට පොලිස් නිලධරයන්ට සහ මිල පාලන පරීක්ෂකවරුන්ට ඇති බලය.

29. උප පොලිස් පරීක්ෂකවරයකුගේ තත්ත්වයට නොඅඩු තත්ත්වයක යම් පොලිස් නිලධරයකුට හෝ යම් මිල පාලන පරීක්ෂකවරයකුට පහත දැක්වෙන ක්‍රියා කිරීමට බලය තිබිය යුතු ය.

(අ) ශ්‍රී ලංකාව තුළ යම් ස්ථානයක හෝ ප්‍රදේශයක යම් වෙළෙඳාමක කාර්ය සඳහා භාවිත කරනු ලබන යම් ස්ථානයකට ඇතුළු වී, මිළ දී ගන්නකුට බඩු භාරදීමේ කාර්යය සඳහා කරනු ලබන හෝ කරනු ලැබූ යම් බර කිරීමක හෝ මැනීමක හරි වැරදි බැලීම;

(ආ) මේ පනතේ 42 වන වගන්තිය කඩකරමින් එසේ භාර දෙන ලද යම් බඩු, ඒ වගන්තිය යටතේ වූ වරදක් සඳහා වූ නඩු කටයුතුවල කාර්යය සඳහා තහනම්ව ගෙන රඳවා තබාගැනීම අවශ්‍ය වූ අවස්ථාවක එසේ තහනම්ව ගෙන රඳවා තබා ගැනීම.

## V වන කොටස

### වෙනත් ව්‍යවස්ථාපිත මිමි

යම් මිම්මක් හෝ මනින උපකරණයක් සැලසුම් සහ නිෂ්පාදනය කිරීම හෝ සහතික කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් විධාන කළ හැකි බව.

30. (1) සෞඛ්‍ය ආරක්ෂා කිරීම, යම් තැනැත්තකුගේ ආරක්ෂාව, දූෂණ පාලනය කිරීම හෝ පරිසරය ආරක්ෂා කිරීම සඳහා භාවිත කෙරෙන යම් මිම්මක් හෝ මනින උපකරණයක් හෝ කර්මාන්තවල හෝ තත්ත්ව පාලනයෙහි භාවිත වන යම් මිම්මක්, විධානයෙහි දක්වෙන ආකාරයට වාරානුකූලව සත්‍යායනය හෝ සහතික කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු බව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන විධානයක් මගින් අමාත්‍යවරයා විසින් කලින් කල විධාන කළ හැකි ය. එවැනි සෑම වාරානුකූල සත්‍යායනය කිරීමක් හෝ සහතික කිරීමක් ක්‍රියාවේ යෙදීම සම්බන්ධයෙන් නියම කරනු ලබන ගාස්තුවක් අය කළ හැකි ය.

(2) (1) උපවගන්තිය යටතේ විධානයක් කරනු ලද අවස්ථාවක, ඒ මිමි සහ මනින උපකරණ සඳහා වූ පිරිවිතර, අවසර දෙනු ලබන සහිෂ්ණුතාව හා ඒවා පරීක්ෂා කිරීමේ ක්‍රම නියමිත පරිදි විය යුතු ය.

ආණ්ඩුවේ දෙපාර්තමේන්තු හෝ සංස්ථා විසින් භාවිත කරනු ලබන මිමි හෝ මනින උපකරණ පරීක්ෂණාගාරයේ දී අංක ශෝධනය කරනු ලැබිය යුතු බව.

31. සහතික කිරීමේ හෝ අංක ශෝධනය කිරීමේ කාර්යය සඳහා හෝ යම් තාක්ෂණික කාර්යයක් උදෙසා යම් මිම්මක හරි වැරදි බැලීමේ කාර්යය සඳහා යම් මනින උපකරණයක් පරීක්ෂා කිරීම හෝ එහි හරි වැරදි බැලීම සඳහා මිම්මක් හෝ මනින උපකරණයක් භාවිත කරන සෑම ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්ම හෝ සංස්ථාවක්ම ගැසට් පත්‍රයෙහි තත්කාර්ය සඳහා පළ කරනු ලබන විධානයක් මගින් නිශ්චය කරනු ලබන වාර අනුව ඒ මිම්ම හෝ මනින උපකරණය පරීක්ෂණාගාරයේ දී අංක ශෝධනය කරවා ගත යුතු ය.

ඉඩම් පිළිබඳ ගනුදෙනුවල දී භාවිත කළ යුතු මිනුම් ඒකක.

32. ඉඩම් පැවරීම පිළිබඳ සියලු ගනුදෙනුවල දී සෑම ඉඩම් ප්‍රමාණයක්ම මැනීම මෙහි දෙවන හා තුන්වන උපලේඛනවල දක්වා ඇති මිනුම් ඒකක වලින් විය යුතු ය:

එසේ වුව ද, පැවරීම, 1983 ජනවාරි මස 1 වන දිනට කලින් වූ දිනක ලියන ලද හෝ ඔප්පුවක මායිම් විස්තර කර ඇති ඉඩමකට අදාළ වන විට එහි ලා භාවිත කරන ලද මිනුම් ඒකකය ඒ ඔප්පුවේ සඳහන් කරනු ලැබිය හැකි ය. එහෙත් එසේ කිරීම මෙහි දෙවන සහ තුන්වන උපලේඛනවල දක්වා ඇති අනුමත ඒකකයකින් වූ ඊට සමාන ප්‍රමාණයද සඳහන් කරන ලැබිය යුතු ය යන කොන්දේසියට යටත් විය යුතු ය. එක් එක් පරිවර්තනය තත්කාර්ය සඳහා නියෝග මගින් නියමිත පරිවර්තන සාධක භාවිත කිරීමෙන් ලබාගත යුතු ය:

එසේම තවදුරටත් ඉඩමේ ප්‍රමාණය. නියම කරනු ලබන සම්ප්‍රදායික ඒකක වලින් විස්තර කර ඇති අවස්ථාවක, නියම කරනු ලබන කාලයක් තුළ එවැනි පරිවර්තනයක් අවශ්‍ය නොවිය යුතු ය.

## VI වන කොටස

### කර්මාන්ත ආදිය සඳහා වූ මිනුම්.

මනින උපකරණ සහ මිනුම් උපක්‍රම අංක ශෝධනය කිරීම සඳහා අධ්‍යක්ෂවරයා පහසුකම් සැලසිය යුතු බව.

33 කර්මාන්තවල, ඉංජිනේරු කටයුතුවල හෝ වෙනත් යම් ක්ෂේත්‍රයක භාවිත වන පඩි හෝ මිම්ම හෝ කිරන හෝ මනින උපකරණ අංක ශෝධනය කිරීම සඳහා අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා අදහස් කරන පහසුකම් අධ්‍යක්ෂවරයා විසින් සැලසිය යුතු ය. ඒ සෑම අංක ශෝධනයක්ම ශ්‍රී ලංකා ප්‍රමිති හෝ පරීක්ෂණාගාරය විසින් පවත්වා ගෙන යනු ලබන ආශ්‍රෙය ප්‍රමිතියක් අනුව කර තිබිය යුතු ය.

වෙළඳාමේ හෝ කර්මාන්තයේ භාවිත වන පඩි, මිම් ආදියේ සැලසුම් පරීක්ෂණාගාරයෙන් අනුමත කළ යුතු බව.

34. කර්මාන්ත සඳහා භාවිත වන සියලු පඩි වල, මිම් වල හෝ කිරන හෝ මනින උපකරණවල සැලසුම ඒවා නිෂ්පාදනය කිරීමට හෝ ආනයනය කිරීමට පෙර පරීක්ෂණාගාරය විසින් අනුමත කරනු ලැබිය යුතු ය. වෙනත් යම් කාර්යයක් සඳහා භාවිත වන මනින උපකරණ හා සම්බන්ධ සැලසුම් අනුමත කිරීම සඳහා වූ අවශ්‍යතා නියම කිරීමේ බලය අමාත්‍යවරයාට තිබිය යුතු ය.

## VII වන කොටස

### අරමුදල

අරමුදල.

35. (1) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වරයා විසින් විධාන කරනු ලබන ආකාරයකින් පවත්වා ගෙන යායුතු අරමුදලක් මේ පනතේ කාර්යය සඳහා පිහිටුවිය යුතු ය.

(2) අයකරනු ලබන සහ නියම කරනු ලබන සෑම ගාස්තුවකින් තුනෙන් දෙපංගුවක් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය. සෑම ගාස්තුව කින්ම ඉතිරි තුනෙන් පංගුව ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) අරමුදලින් පහත දැක්වෙන මුදල් ගෙවිය යුතු ය :—

(අ) නෛතික මිති විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සංවිධාන සාමාජික රාජ්‍යයක් වශයෙන් ගෙවිය යුතු වාර්ෂික ගාස්තු හා වෙනත් ගෙවීම් වශයෙන් ගෙවන ලද සියලු මුදල් ප්‍රමාණ සහ එහි රැස්වීම්වලට සහභාගිවීමෙහි ලා දරන ලද වියදම්;

(ආ) ශ්‍රී ලංකා ආශ්‍රෙය ද්විතීයික සහ තෘතීයික ප්‍රමිති අන්තර් සංසන්දනය සඳහා වූ යම් ජාත්‍යන්තර හෝ කලාපීය වැඩ සටහනකට සහභාගි වීමෙහි ලා දරන ලද වියදම් ඇතුළුව ඒ ප්‍රමිති අංක ශෝධනයෙහි ලා දරන ලද සියලු වියදම් ;

(ඇ) මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව සහ පරීක්ෂණාගාරය ද ප්‍රමිති පවත්වා ගෙන යනු ලබන වෙනත් සියලු කාර්යාල ද නඩත්තු කිරීමේ වියදම් වශයෙන් දරන ලද සියලු වියදම් ;

(ඇ) යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට ත්‍යාග වශයෙන් 57 වන වගන්තිය යටතේ ගෙවන ලද සියලුම මුදල් ප්‍රමාණ ;

(ඉ) මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුවේ සහ පර්යේෂණාගාරයේ භාවිත කෙරෙන යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ වාහන නඩත්තු කිරීමෙහි ලා දරන ලද සියලු වියදම්;

(ඊ) පඩි හා මිමි සහ කිරන හා මනින උපකරණ පරීක්ෂා කිරීමට සහ සත්‍යායනය කිරීමට 24 වන වගන්තිය යටතේ පහසුකම් සැලසීමෙහි ලා දරන ලද සියලු වියදම් ;

(උ) මේ පනතේ V වන සහ VI වන කොටස් යටතේ අංක ශෝධන පහසුකම් සැපයීමෙහි ලා සහ 20 වන වගන්තිය යටතේ යම් පඩියක, මිම්මක සහ කිරන හෝ මනින උපකාරණයක සැලසුම් පරීක්ෂා කිරීමෙහි ලා දරන ලද සියලු වියදම් ;

(ඌ) මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව සහ පර්යෙෂණාගාරයේ නිසි කළමනාකරණය සහ පරිපාලනය යට ආනුෂංගික සියලු වියදම්.

(4) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, එක් එක් මුදල් වර්ෂයේ අවසානයෙන් පසු හැකිතාක් ඉක්මනින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් පිළියෙල කළයුතු අතර, එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් අරමුදල පිළිබඳ සම්පූර්ණ හා නිසි ගිණුමක් පවත්වාගෙන යාමට සැලැස්විය යුතු ය.

(5) විගණකාධිපතිවරයා විසින් අරමුදලේ ගිණුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව විගණනය කළ යුතු ය.

(6) අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

## VIII වන කොටස

## වැරදි සහ දණ්ඩන

36. නියමිත සත්‍යායනය ලකුණින් පරීක්ෂකවරයකු විසින් මුද්‍රා තබනු නොලැබූ යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් විකුණන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට හෝ තුන් මාසයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

මුද්‍රා නොතැබූ පඩි ආදිය විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම.

මුද්‍රා නොතැබූ පඩි ආදිය භාවිත කිරීම සහ ඒ සම්බන්ධයෙන් සන්තකයේ තබා ගැනීම.

37. පෙරතුවම වූ දොළොස් මාසක කාලය තුළ නියමිත සත්‍යාපන ලකුණින් පරීක්ෂකවරයකු විසින් මුද්‍රා තබනු නොලැබූ යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් යම් වෙළෙඳාමක කාර්යය සඳහා භාවිත කරන හෝ එසේ භාවිත කිරීම සඳහා තම සන්තකයේ තබා ගන්නා යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්දහසක් නොවැඩි දඩයකට හෝ හය මාසයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

පරීක්ෂකවරුන් විසින් භාවිත කරනු ලබන මුද්‍රාව හෝ ලකුණ ව්‍යාජ ලෙස සෑදීම

38. පහත දක්වෙන ක්‍රියාවන් කරන යම් තැනැත්තකු එනම් :—

(අ) පඩි හෝ මිම් හෝ කිරන හෝ මනින උපකරණ මුද්‍රා තැබීමේ දී පරීක්ෂකවරුන් විසින් භාවිත කිරීම සඳහා මේ පනත යටතේ සපයා ඇති යම් මුද්‍රාවක් හෝ ලකුණක් ව්‍යාජ ලෙස තනන හෝ කූට අනුකරණයක් කරන ; හෝ

(ආ) ව්‍යාජ වූ යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක්, හෝ ව්‍යාජ බව, ව්‍යාජ ලෙස තනන ලද බව හෝ කූට අනුකරණයක් බව තමන් දන්නා යම් මුද්‍රාවක් හෝ ලකුණක් සහිත යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් සාදන, භාවිතා කරන, විකුණන, විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන, විකිණීම සඳහා සංසරණයට පත් කරන හෝ වෙළෙඳාමේ දී භාවිත කිරීම සඳහා ස්ථානයේ තබා ගන්නා හෝ වෙනත් ක්‍රමයකින් බැහැර කරන ; හෝ

(ඇ) පරීක්ෂකවරයකු විසින් යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් මත මුද්‍රා තබා ඇති යම් ලකුණක් ඉවත් කරන සහ ඒ ලකුණ වෙනත් යම් පඩියක්, මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයට ඇතුළත් කරන ; හෝ

(ඈ) පරීක්ෂකවරයකු විසින් මේ පනත යටතේ මුද්‍රා තබන ලද හෝ සහතික කරන ලද පඩියක් හෝ මිම්මක් වැඩි කරන හෝ අඩු කරන හෝ පරීක්ෂකවරයකු විසින් මේ පනත යටතේ මුද්‍රා තබන ලද හෝ සහතික කරන ලද කිරන හෝ මනින උපකරණයක් අයතු ලෙස වෙනස් කරන හෝ එසේ අඩු කරන ලද බව හෝ ව්‍යාජ බව තමන් දන්නා පඩියක් හෝ මිම්මක් හෝ අයතු ලෙස වෙනස් කරන ලද උපකරණයක් බව තමන් දන්නා යම් කිරන හෝ මනින උපකරණයක් පාවිච්චි කරන, විකුණන, විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන, විකිණීම සඳහා සංසරණයට පත් කරන හෝ වෙළෙඳාමේ දී භාවිත කිරීම සඳහා තම සන්තකයේ තබා ගන්නා හෝ වෙනත් ක්‍රමයකින් බැහැර කරන ;

යම් තැනැත්තකු, වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

39. යම් ව්‍යාජ පඩියක් හෝ දිග හෝ ධාරිතාව පිළිබඳ ව්‍යාජ මිම්මක් හෝ තමා භාවිත කරන පඩිය හෝ මිම්ම යම් පඩියක් හෝ මිම්මක් වන්නේ ද එම පඩියට හෝ මිම්මට වෙනස් පඩියක් හෝ මිම්මක් බව පෙන්නුම් කරමින් යම් පඩියක් හෝ දිග හෝ ධාරිතාව පිළිබඳ යම් මිම්මක් භාවිත කරන කවර හෝ තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් දහසකට නොවැඩි දඩයකින් හෝ අවුරුද්දකට නොවැඩි කාලයක් බන්ධනාගාරගත කිරීමෙන් හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකින් හෝ දඬුවම් කරනු ලැබිය යුතු ය.

ව්‍යාජ පඩි හෝ දිග හෝ ධාරිතාව පිළිබඳ ව්‍යාජ මිම්ම් භාවිත කිරීම.

40. 21 වන වගන්තියේ විධිවිධාන යටතේ අධ්‍යක්ෂවරයා විසින් ලියාපදිංචි කරනු නොලැබ, යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් අලුත්වැඩියා කරන හෝ නිෂ්පාද -නය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ හය මාසයකට නොවැඩි කාලයක් බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

ලියාපදිංචි නොවූ යම් පඩි හෝ මිම්ම් ආදිය අලුත්වැඩියා කිරීම සහ නිෂ්පාදනය කිරීම.

41. 24 වන වගන්තිය යටතේ පරීක්ෂකවරයකුට පවරනු ලැබ ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා පරීක්ෂකවරයකු විසින් නියම කරනු ලැබූ විට යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

පරීක්ෂණය සඳහා පඩි ආදිය ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කිරීම

42. යම් ස්ථානයක දී හෝ ප්‍රදේශයක දී යම් භාණ්ඩ හෝ දේවල් මිලට ගැනීම, විකිණීම, කිරීම හෝ මැනීම සම්බන්ධයෙන් හෝ කරන ලද සේවා සඳහා බර හෝ මිම් පදනම් කොට ගෙන අය කිරීම් කිසිවක් ආගණනය කිරීමේ දී හෝ භාණ්ඩවල හෝ දේපල සංඛ්‍යාව, ප්‍රමාණය, මිනුම්, ආමානය හෝ බර පිළිබඳව යම් ව්‍යාජ, සාවද්‍ය හෝ අසත්‍ය ප්‍රකාශනයක් හෝ ප්‍රකාශයක් කෙලින්ම හෝ අනානකාර දී

ව්‍යාජ සාවද්‍ය හෝ අසත්‍ය ප්‍රකාශන හෝ ප්‍රකාශ ආදිය

තාවර හෝ ක්‍රමයකින් කරන, නැතහොත් බරින් හෝ මිනුමින් යම් ඉදයක් විකුණුම්කරුගෙන් ඉල්ලා සිටි ප්‍රමාණයට හෝ විකුණුම්කරු විසින් කියාපාන ලද ප්‍රමාණයට අඩු ප්‍රමාණයක් ගැනුම්කරුවකුට විකුණා හෝ විකිණීමට සලස්වන හෝ භාර දෙන හෝ භාර දීමට සලස්වන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

**වැරදි පඩියක් හෝ මිම්මක් භාවිත කිරීම හෝ සන්තකයේ තබා ගැනීම.**

**43.** යම් වැරදි පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් යම් වෙළෙඳාමක කාර්යය සඳහා පාවිච්චි කරන හෝ යම් වෙළෙඳාමක දී පාවිච්චි කිරීමට තම සන්තකයෙහි තබා ගෙන සිටින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරද කරු කරනු ලැබූ විට රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට හෝ හය මාසයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

**පරීක්ෂකවරුන් විසින් විධිවිධාන කඩකිරීම.**

**44.** IV වන කොටසේ යම් විධිවිධානයක් හෝ පඩි හෝ මිමි හෝ කිරන හෝ මනින උපකරණ පරීක්ෂණයට භාජනය කිරීම, සත්‍ය යනය කිරීම හෝ ඒවාට මුද්‍රා තැබීම සම්බන්ධ යම් නියෝගයක විධිවිධානයක් කඩ කරන යම් පරීක්ෂකවරයකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහස් පන් සියයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

**30 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයක් ඉටුකිරීම පැහැර හැරීම.**

**45.** අමාත්‍යවරයා විසින් 30 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයකට අනුව යම් මිම්මක් හෝ මනින උපකරණයක් අංක ශෝධනය කරවා ගැනීම පැහැර හරින යම් තැනැත්තකු වරද කට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහ සකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

**පොදු දණ්ඩනය.**

**46.** මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක හෝ යම් විධිවිධානයක් කඩ කිරීම සම්බන්ධයෙන් දඬුවමක් සඳහා ප්‍රකාශිතව විධිවිධාන සලස්වා නැත්තේද එවැනි විධිවිධානයක් කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත් වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූවිට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

පඩි ආදිය රාජ්‍ය සන්තක කිරීම.

**47.** යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණ සක් සම්බන්ධයෙන් මේ පනත යටතේ වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට, යම් අධිකරණයක් විසින්, ඒ පඩිය හෝ මිම්ම හෝ කිරන හෝ මනින උපකරණය රාජ්‍ය සන්තක කරන ලද බවට ප්‍රකාශ කරන ආඥාවක් කළ හැකි ය. එසේ රාජ්‍ය සන්තක කරනු ලැබූ සෑම පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උප කරණයක්ම නියම කරනු ලබන ආකාරයකින් බැහැර කරනු ලැබිය යුතු ය.

සන්තකය පිළිබඳ සාක්ෂ්‍ය.

**48.** යම් වෙළෙඳාමක් කරගෙන යන යම් තැනැත්තකුගේ සන්තක යෙහි තිබී හෝ යම් වෙළෙඳාමක කාර්යයන් සඳහා යම් තැනැත්තකු විසින් පාවිච්චි කරනු ලබන යම් ස්ථානයක තිබී සොයා ගන්නා යම් පඩියක් හෝ මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් වෙළෙඳා මේ දී භාවිත කිරීම සඳහා එම තැනැත්තාගේ සන්තකයෙහි තිබෙන ලෙස, එය එසේ නොවන බව ඔප්පු කරනු ලබන තුරු, මේ පනතේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතු ය.

නඩු පැවරීම සඳහා අනුමැතිය.

**49.** මේ පනත යටතේ වූ යම් වරදක් සඳහා යම් තැනැත්තකුට විරුද්ධව කිසිම නඩු පැවරීමක්, ඒ වරද සිදු කරන ලදැයි කියනු ලබන්නේ යම් දිස්ත්‍රික්කයක ද නැතහොත් ප්‍රදේශයක ද ඒ දිස් ත්‍රික්කයේ හෝ ප්‍රදේශයේ මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධි කාරිවරයා විසින් මිස නැතහොත් ඒ අධිකාරිවරයාගේ ලිඛිත අනුමතිය ඇතිව මිස නොකළ යුතු ය.

## IX වන කොටස

### පොදු විධිවිධාන

සහකාර අධ්‍යක්ෂක වරුන් හා අධිකාරි වරුන් විසින් කරනු ලබන ප්‍රාදේශීය විභාග.

**50.** (1) ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් තුළ මේ පනතේ කාර්යය පරිපාලනය කිරීම හා සම්බන්ධයෙන් විභාගයක් පවත්වන ලෙස, අධ්‍යක්ෂවරයා විසින් කලින් කල යම් සහකාර මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අධ්‍යක්ෂවරයකුට හෝ යම් මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අධිකාරිවරයකුට විධාන කළ හැකි ය.

(2) යම් ප්‍රදේශයක් තුළ විභාගයක් පවත්වන ලෙස (1) වන උප වගන්තිය යටතේ එවැනි යම් සහකාර අධ්‍යක්ෂවරයකුට හෝ එවැනි යම් අධිකාරිවරයකුට විධාන කරනු ලැබූ අවස්ථාවක, ඔහු—

(අ) ඒ ප්‍රදේශය සඳහා හෝ ඒ ප්‍රදේශයේ කොටසක් වන යම් කොට්ඨාසයක් සඳහා පත් කරන ලද පරීක්ෂකවරුන්ගේ පාවිච්චිය සඳහා සපයා ඇති තාක්ෂණික ප්‍රමිති සහ කිරන සහ මනින උපකරණ ද පරීක්ෂා කළ යුතු ය ;

(ආ) ඒ ප්‍රදේශයේ පඩි හා මිම් සහ කිරන සහ මනින උපකරණ පරීක්ෂා කිරීමේ දී සහ සත්‍යායනය කිරීමේ දී අනුගමනය කරන කාර්ය පරිපාටිය පිළිබඳව විභාග කළ යුතු ය ; නවද

(ඇ) අධ්‍යක්ෂවරයා විධාන කරන වෙනත් විමර්ශණ පැවැත්විය යුතු ය.

(3) යම් ප්‍රදේශයක් තුළ පැවැත්වීමට බලය දෙන ලද විභාගයක් පැවැත්වීමට (1) වන උපවගන්තිය යටතේ විධානය කරනු ලැබූ නිලධරයකු විසින්, ඒ විභාගයේ කාර්යය සඳහා මේ පනතින් හෝ මේ පනත යටතේ පරීක්ෂකවරයකුට පැවරුනු සියලුම බලතල ක්‍රියාත්මක කළ යුතු ය; ක්‍රියාත්මක කළ හැකි ය.

නිශ්චිත ඇසුරු භාණ්ඩ සහ යම් ඇසුරුමක අඩංගු විය යුතු ප්‍රමාණය ප්‍රකාශයට පත් කිරීම ද.

51. (1) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් යම් භාණ්ඩ, මේ වගන්තියේ කාර්ය සඳහා (මෙහි මින් මතු "නිශ්චිත ඇසුරු භාණ්ඩ" යනුවෙන් සඳහන් කරනු ලබන) නිශ්චිත ඇසුරු භාණ්ඩ වන බව ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් අසුරන්නකු විසින් හෝ ආනයනය කරන්නකු විසින් හෝ ඇසුරුමක අඩංගු නිශ්චිත ඇසුරු භාණ්ඩ විකුණනු ලබන අවස්ථාවක, එම අසුරන්නා හෝ ආනයනය කරන්නා මේ වගන්තියේ විධිවිධාන වලට යටත් විය යුතු ය.

(3) ඇතැම් නිශ්චිත ඇසුරු භාණ්ඩ සම්බන්ධයෙන් යම් ඇසුරුමක අඩංගු විය යුතු ප්‍රමාණය අධ්‍යක්ෂවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් ප්‍රකාශ කරනු ලැබිය හැකි අතර, වෙනත් සියලු නිශ්චිත ඇසුරු භාණ්ඩ සම්බන්ධයෙන් ඇසුරුමක අඩංගු විය යුතු ප්‍රමාණය අවස්ථාවෝචිත පරිදි අසුරන්නකු හෝ ආනයනය කරන්නකු හෝ විසින් තීරණය කරනු ලබන පරිදි විය යුතු ය.

(4) යම් නිශ්චිත ඇසුරු භාණ්ඩයක අසුරන්නකු හෝ ආනයනය කරන්නකු වන යම් තැනැත්තකු විසින් ඒ ඇසුරුමෙහි—

(අ) බර හෝ පරිමාව හෝ දිග පිළිබඳ, අනුමත ඒකකවලින් අඩංගු ප්‍රමාණය පිළිබඳව ප්‍රකාශයක්; සහ

(ආ) ඔහුගේ නම සහ ලිපිනය හෝ ඔහුගේ නම සහ ලිපිනය පරීක්ෂකවරයකුට පහසුවෙන් දැනගත හැකිවන පරිදි වූ ලකුණක්

නියමිත ආකාරයට සටහන් කර තිබෙන බවට වගබලා ගැනීම එම තැනැත්තාගේ යුතුකම වන්නේ ය.

(5) ශ්‍රී ලංකාවෙහි අසුරන ලද හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ නිශ්චිත ඇසුරු භාණ්ඩ අඩංගු යම් ඇසුරුමක අඩංගු ප්‍රමාණයයෙහි නිරවද්‍යතාව නිර්ණය කිරීම පිණිස අනුගමනය කළ යුතු ක්‍රම හා පරීක්ෂාවන් අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

(6) යම් නිශ්චිත ඇසුරු භාණ්ඩ අසුරන්නකු හෝ ආනයනය කරන්නකු වන්නා වූ ද—

(අ) ඇසුරුම මත වූ ප්‍රකාශයේ දක්වා ඇති ප්‍රමාණයට අඩුවෙන් යම් නිශ්චිත ඇසුරු භාණ්ඩ අසුරන්නා වූ හෝ ආනයනය කරන්නා වූ ද; නැතහොත්

(ආ) යම් ඇසුරුමක අඩංගු ප්‍රමාණය, අනුමත ඒකක වලින් ඒ ඇසුරුම මත ලකුණු කිරීම පැහැර හරින්නා වූ ද,

යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබූ පසු රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

*අනුමත ඒකකවලින් ලකුණු නොකරන ලද ඇසුරු භාණ්ඩ විකිණීම වරදක් බව.*

52. යම් නිශ්චිත ඇසුරු භාණ්ඩ අඩංගු යම් ඇසුරුමක්, එහි අඩංගු ප්‍රමාණය අනුමත ඒකකවලින් ඒ මත ලකුණු කරනු නොලැබ විකුණන්නා වූ හෝ විකිණීම පිණිස ප්‍රදර්ශනය කරන්නා වූ යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

*ආරවුල් බේරුම් කිරීම.*

53. යම් පඩියක්, මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් පරීක්ෂා කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රම පිළිබඳව, පරීක්ෂකවරයකු හා වෙනත් යම් තැනැත්තකු අතර යම් ආරවුලක් පැන නැගුනහොත්, ඒ පරීක්ෂකවරයාගේ හෝ ඒ වෙනත් තැනැත්තාගේ ඉල්ලීම පිට, ඒ ආරවුල පිළිබඳව අධ්‍යක්ෂවරයා විසින් තීරණයක් කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

*අධ්‍යක්ෂවරයාගේ, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ හෝ සහකාර අධ්‍යක්ෂවරයාගේ සහතිකය එහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂි විය යුතු බව.*

54. තමා විසින් පරීක්ෂා කරන ලද යම් පඩියක හෝ මිම්මක හෝ කිරන හෝ මනින උපකරණයක තත්ත්වය සම්බන්ධයෙන් මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා අධ්‍යක්ෂවරයා, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා හෝ සහකාර අධ්‍යක්ෂවරයකු විසින් නිකුත් කරන ලදැයි අදහස් වන සහතිකයක්, තවදුරටත් ඔප්පු කිරීමක් නොමැතිවම, යම් අධිකරණයක දී ආවේශ්‍ය විය යුතු අතර එහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් එය බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් විය යුතු ය.

*සේවකයන්ගේ සහ අනුයෝජිතයන්ගේ වැරදිවලට ප්‍රධානියා වගකිව යුතු බව.*

55. මේ පනත යටතේ වූ වරදක්, යම් නිෂ්පාදකයකුගේ හෝ වෙළෙන්දකුගේ අනුයෝජිතයකු හෝ සේවකයකු විසින් සිදු කරන ලද අවස්ථාවක එම වරද තමාගේ දැනුම නොමැතිව සිදු කරන ලද බව ඒ නිෂ්පාදකයා හෝ වෙළෙන්දා ඔප්පු කළහොත් මිස, ඒ වරද ඒ නිෂ්පාදකයා හෝ වෙළෙන්දා විසින් සිදු කරන ලදැයි සැලකිය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි

56. මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරන ලද අවස්ථාවක—

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, එම වරද සිදු කරන ලද අවස්ථාවේ ඒ පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකුව සිටි සෑම තැනැත්තකු ; හෝ

(ආ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවන මණ්ඩලයක් නම්, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ එම මණ්ඩලයේ සාමාජිකයකුව සිටි සෑම තැනැත්තකු

එම වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, එම වරද තමාගේ දැනුම නොමැතිව සිදු කරන ලද බව හෝ එම වරද සිදු කිරීම වැළැක්වීමට තමා නිසි සියලු උද්යෝගයෙන් කටයුතු කළ බව ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ සාමාජිකයා ඔප්පු කළහොත් ඔහු ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

ඇතැම් තැනැත්තන්ට ත්‍යාග දීම.

57. යම් තැනැත්තකු මේ පනත යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක හෝ යම් භාණ්ඩයක් මේ පනත යටතේ තහනමට ගෙන රාජ්‍ය සන්තක කිරීමට නියම කරනු ලැබූ අවස්ථාවක, සාධාරණ යයි අධ්‍යක්ෂවරයා විසින් අදහස් කරනු ලබන ත්‍යාගයක්,—

(අ) ඒ වරදකරු කිරීමට හෝ ඒ භාණ්ඩය තහනමට ගෙන රාජ්‍ය සන්තක කිරීමට හේතු වූ තොරතුරු සැපයූ තැනැත්තාට හෝ තැනැත්තන්ට ; සහ

(ආ) ඒ වරද අල්ලා ගැනීමෙහි හෝ ඒ භාණ්ඩය තහනමට ගෙන රාජ්‍ය සන්තක කිරීමෙහි ලා සම්බන්ධ වූ යම් තැනැත්තකුට අමාත්‍යවරයා විසින් දිය හැකි ය.

19 වන අධිකාරයේ 257, 258, 259 සහ 260 වන වගන්ති ඉවත් කිරීම සහ ඉතිරි කිරීම.

58. (1) (19 වන අධිකාරය වන) දණ්ඩ නීති සංග්‍රහයේ 257 වන, 258 වන, 259 වන සහ 260 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ඉහත සඳහන් වගන්ති ඉවත් කරනු ලැබුවද, නියමිත දිනයේ දී යම් මුල් හෝ අභියාචනා අධිකරණයක එවකටත් පවරනු ලැබ නොනිමිව පවත්නා සෑම නඩුවක් හෝ අපරාධ නඩුවක්ම එකී ඉවත් කරන ලද වගන්ති යටතේ දිගටම පවත්වා ගෙන ගොස් අවසාන නඩු තීන්දුව දක්වා කටයුතු කළ යුතු ය.

158 වන අධිකාරය ඉවත් කිරීම සහ ඉතිරි කිරීම.

59. (1) (158 වන අධිකාරය වන) පඩි හා මිම් ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ඉහත කී ආඥාපනත ඉවත් කරනු ලැබුවද—

(අ) නියමිත දිනයට පෙර පරීක්ෂකවරයකු විසින් කරන ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් වලංගු ලෙස කරන

ලද සේ සියලු කාර්ය සඳහා සැලකිය යුතු අතර ඒ ක්‍රියාව හෝ දෙය, මේ පනතේ විධිවිධාන යටතේ කළ සේ බල සහිත විය යුතු ය;

(ආ) ඉවත් කරන ලද ආඥාපනතේ 14 වන සහ 15 වන වගන්ති යටතේ ලබා ගන්නා ලද සහ සත්‍යාපනය කරන ලද සෑම බර හෝ මිම් පිළිබඳ ප්‍රමිතියක්ම මේ පනතේ කාර්ය සඳහා වූ බර හෝ මිම් පිළිබඳ ප්‍රමිතියක් ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය;

(ඇ) ඉවත් කරන ලද ආඥාපනතේ 16 වන වගන්තිය යටතේ සත්‍යාපනය කරන ලද සහ සැබෑ බවට සහතික කරනු ලද බර හෝ මිම් පිළිබඳ සෑම ද්විතියික ප්‍රමිතියක්ම සහ ඉවත් කරන ලද ආඥාපනතේ 17 වන වගන්තිය යටතේ සැබෑ බවට සහතික කරන ලද සෑම භාවිත ප්‍රමිතියක්ම මේ පනතේ කාර්ය සඳහා පිළිවෙළින්, ද්විතියික හෝ තෘතීයික ප්‍රමිතියක් වන ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය; තවද,

(ඈ) යම් අනුමත පඩියක් හෝ මිම්මක් හෝ යම් කිරන හෝ මනින උපකරණයක් විකිණීම, නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා ඉවත් කරන ලද ආඥාපනතේ 31 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම මේ පනතේ විධිවිධාන යටතේ වලංගු ලෙස නිකුත් කරන ලද්දක් ලෙස සලකනු ලැබිය යුතු ය.

60. (1) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත කාරණා හෝ නියෝග සාදනු ලැබීමට මේ පනතින් බලය දී ඇති කාරණා සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) විශේෂයෙන් හා (1) වන උපවගන්තිය යටතේ පැවරුනු බල තලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් යමක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) 14 වන වගන්තියේ (3) උපවගන්තිය යටතේ පරීක්ෂක වරයකු ලෙස පත් කරනු ලැබීම සඳහා යම් තැනැත්තකු විසින් සමත් විය යුතු යම් නියමිත පරීක්ෂණ;

(ආ) ශ්‍රී ලංකා ප්‍රමිතිවල, ආශ්‍රෙය ප්‍රමිතිවල සහ ද්විතියික හා තෘතීයික ප්‍රමිතිවල ආරක්ෂාභාරය සහ සංරක්ෂණය;

(ඇ) ආශ්‍රෙය ප්‍රමිති, ද්විතියික ප්‍රමිති සහ තෘතීයික ප්‍රමිති සැබෑ බවට සහතික කිරීමේ සහ සත්‍යාපනය කිරීමේ ක්‍රමය;

(ඈ) තෘතියික ප්‍රමිතිවල පිරිවිතර සහ ඒ ප්‍රමිති තබාගත යුතු හා සංරක්ෂණය කළ යුතු පිළිවෙල ;

(ඉ) ද්විතීයික සහ තෘතියික ප්‍රමිති පරීක්ෂා කිරීමේ හා ඒවාට මුද්‍රා තැබීමේ පරිපාටිය සහ පරීක්ෂකවරුන්ගේ භාවිතය සඳහා සපයා ඇති කිරන සහ මනින උපකරණ වාරානුකූලව සත්‍යායනය කිරීම ;

(ඊ) පඩිවල හා මිම්වල සහ කිරන හා මනින උපකරණවල සංයුතිය, ආකාරය සහ පිරිවිතර පිළිබඳ නියමයන් සහ ඒ නියමයන්ට අනුකූල නොවන පඩි හා මිම් සහ කිරන සහ මනින උපකරණ නිෂ්පාදනය කිරීම හෝ භාවිත කිරීම තහනම් කිරීම ;

(උ) පරීක්ෂකවරුන් විසින් පඩි, මිම් හා කිරන සහ මනින උපකරණ, පරීක්ෂා කිරීම, සත්‍යායනය කිරීම සහ ඒවාට මුද්‍රා තැබීම, පඩිවල සහ මිම්වල නිරවද්‍යතාව සහ කාර්යක්ෂමතාව දැන ගැනීමේ කාර්යය සඳහා යොදා ගත යුතු පරීක්ෂා, පරීක්ෂකවරුන් විසින් භාවිත කළ යුතු මුද්‍රාවල ආකාරය සහ රටාව, මුද්‍රා පාවිච්චි කළ යුතු අකාරය සහ එසේ මුද්‍රා තැබීම තහනම් කළ යුත්තේ කවර අවස්ථාගත කරුණු යටතේ ද යන වග ;

(ඌ) පොදුවේ හෝ යම් වෙළෙඳාමක් සම්බන්ධයෙන් හෝ පඩි, මිම් සහ කිරන සහ මනින උපකරණ සත්‍යායනය කිරීමේ දී ඉඩ දිය යුතු හෝ ඒවා පරීක්ෂා කිරීමේ දී සහ ඒවායේ සැලසුම් අනුමත කිරීමේ දී ගණන් නොගත යුතු දෝෂ සීමාවන් ;

(එ) අඩංගු ශුද්ධ බඩු ප්‍රමාණය, දිග, පරිමාව හෝ බර අනුව ලකුණු කර ඇති ඇසුරු බඩු සම්බන්ධයෙන් රීති, පරීක්ෂා, පරිපාටි සහ ඉඩ දෙනු ලබන සහිෂ්ණුතා ;

(ඒ) භෞතික නියතයන් සහ සියලු කාර්ය සඳහා භාවිත කළ යුතු ඒවායේ අනුරූප සංඛ්‍යාත්මක අගයයන් ;

(ඔ) කාර්මික කාර්ය සඳහා භාවිත කරනු ලබන වර්ණ හා තද බව වැනි ස්වභාවයන්ගේ අගය නිශ්චය කිරීමේ ක්‍රම ;

(ඕ) සත්‍යායන ලකුණු ඉවත් කළ හැක්කේ හෝ මකා දැමිය හැක්කේ කවර අවස්ථාගත කරුණු හා තත්ත්වයන් යටතේ ද, කවර තැනැත්තන් විසින්ද සහ කවර ආකාරයෙන්ද යන වග ;

(ක) පඩි, මිම් සහ කිරන සහ මනින උපකරණ පරීක්ෂා කිරීම සහ සත්‍යායනය කිරීම සඳහා පරීක්ෂකයන් විසින් අය කළ යුතු ගාස්තු සහ සත්‍යායනය සහ පරීක්ෂා කිරීමේ වියදම් ;

(ග) විවිධ උපකරණ අංක ශෝධනය සඳහා වූ ක්‍රම තීරණය කර තහවුරු කළ යුතු ආකාරය ; සහ

(ච) මේ උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් කාරණාවලට හෝ විෂයයන්ට ආනුෂංගික හෝ සම්බන්ධ සියලු කරුණු.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබ දිනයේ සිට හෝ එම නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයකම එම අනනුමතයේ දින සිට එහෙත් ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

61. (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය

"මිම්ම" යන්නෙන්, ද්‍රව්‍යයක පරිමාව නිශ්චය කිරීම සඳහා වූ නියමිත ධාරිතාවකින් යුතු භාජනයක් හෝ ක්‍රමාංකිත දණ්ඩක හෝ පටික දිග අදහස් වේ;

"මනින උපකරණය" යන්නෙන් දිග, වර්ගඵලය, පරිමාව හෝ ධාරිතාව මැනීම සඳහා භාවිත කෙරෙන යම් උපකරණයක් හෝ යම් ප්‍රමාණයක් මැනීම සඳහා වූ යම් උපකරණයක් අදහස් වේ;

"තෘතියික ප්‍රමිතිය" යන්නෙන් ඒ ප්‍රමිතිය සඳහා නියමිත නිරවද්‍යතා පිරිවිතර සහිතව 8 වන වගන්තිය යටතේ ලබා ගන්නා වූ ද, පරීක්ෂකවරයකු විසින් භාවිත කරනු ලබන්නා වූ ද ප්‍රමිතියක් අදහස් වේ;

"වෙළෙඳාම" යන්නෙන් 12 වන වගන්තියෙහි සඳහන් යම් කටයුත්තක්, ගිවිසුමක්, විකිණීමක්, වාසි හුවමාරුවක් හෝ ගනුදෙනුවක් අදහස් වේ;

"මිනුම් ඒකකය" යන්නෙන්, පළමුවන සහ දෙවන උපලේඛන වල දක්වා ඇති යම් මිනුම් ඒකකයක් අදහස් වේ.

"පඩිය" යන්නෙන්, කිරන උපකරණයක් සමග භාවිත කිරීම සඳහා වූ නිශ්චිත ස්කන්ධයක වස්තුවක් අදහස් වේ; තවද,

"කිරන උපකරණය" යන්නෙන් ස්කන්ධය හෝ බර මැනීම සඳහා වූ උපකරණයක් අදහස් වේ.

(2) පහත දැක්වෙන අවස්ථාවල දී පඩියක් හෝ මිම්මක් නිවැරදි ලෙස මේ පනතේ කාර්යය සඳහා සැලකිය යුතු ය :—

(අ) සත්‍යායනය කරනු ලැබූ විට එම පඩිය හෝ මිම්ම එම පඩියේ හෝ මිම්මේ තෘතියික ප්‍රමිතියට අනුකූල වේ නම් හෝ, සත්‍යායනය කිරීමේ දී ඉඩදිය යුතු නියමිත දෝෂ සීමාවට වැඩි දෝෂ සීමාවක් රහිත වේ නම්; හෝ

(ආ) පරීක්ෂා කරනු ලැබූ විට එම පඩිය හෝ මිම්ම, එම පඩියේ හෝ මිම්මේ තෘතියික ප්‍රමිතියට අනුකූල වේ නම් හෝ පරීක්ෂා කිරීමේ දී ගණන් නොගත යුතු දෝෂ සීමාවට වැඩි දෝෂ රහිත වේ නම් ; හෝ

(ඇ) 45 වන වගන්තිය යටතේ වරදක් සිදුකර ඇත්දැයි තීරණය කිරීමේ කාර්යය සඳහා, දෝෂ සීමාව, පරීක්ෂා කිරීමේ දී ඉඩ දෙනු ලබන දෝෂ සීමාව මෙන් දෙගුණයක් නොඉක්මවිය යුතු ය.

(3) පහත දැක්වෙන අවස්ථාවක දී කිරන හෝ මනින උපකරණ නිවැරදි ලෙස මේ පනතේ කාර්යය සඳහා සැලකිය යුතු ය :—

(අ) සත්‍යාපනය කරනු ලැබූ විට, එම කිරන හෝ මනින උපකරණය සත්‍යාපනය කිරීමේ දී ඉඩදිය යුතු නියමිත දෝෂ සීමාවට වැඩි දෝෂ සීමාවක් රහිත වේ නම් ; හෝ

(ආ) පරීක්ෂා කරනු ලැබූ විට, එම කිරන හෝ මනින උපකරණය පරීක්ෂා කිරීමේ දී ගණන් නොගත යුතු නියමිත දෝෂ සීමාවට වැඩි දෝෂ සීමාවක් රහිත වේ නම් ; හෝ

(ඇ) 45 වන වගන්තිය යටතේ වරදක් සිදුකර ඇත්දැයි තීරණය කිරීමේ කාර්යය සඳහා, දෝෂ සීමාව, පරීක්ෂා කිරීමේ දී ඉඩදෙනු ලබන දෝෂ සීමාව මෙන් දෙගුණයක් නොඉක්මවිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

62. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## පළමුවන උපලේඛනය

### අර්ථ කථන

### 1 වන කොටස

**ජාත්‍යන්තර ක්‍රමයේ මූල ඒකක හා ඒවායේ සංකේත පහත සඳහන් පරිදිය.**

1. දිග මැනීම සඳහා මීටරය ... ... සංකේතය : m
ස්කන්ධය නොහොත් බර මැනීම සඳහා කිලෝ ග්‍රෑම ... සංකේතය : kg
කාලය මැනීම සඳහා තත්පරය ... ... සංකේතය : s
විද්‍යුත් ධාරා තීව්‍රතාව මැනීම සඳහා ඇම්පියරය ... සංකේතය : A
තාප ගතික උෂ්ණත්වය මැනීම සඳහා කෙල්වීනය ... සංකේතය : K
ප්‍රදීපන තීව්‍රතාව මැනීම සඳහා කැන්ඩෙලාව ... සංකේතය : cd
ද්‍රව්‍ය ප්‍රමාණය මැනීම සඳහා මවුලය ... ... සංකේතය : mol

### මූල ඒකක පිළිබඳ අර්ථ කථන

1.1. දිග මැනීමේ ඒකකය මීටරය (m) යි.—මීටරය යනු තත්පර 1/299792458 ක කාලාන්තරයකදී රික්තය තුළ දී ආලෝකය ගමන් කරන පථයේ දිගවේ. (1983, 17 වන සී. පී. පී. එම්.)

1.2. ස්කන්ධය මැනීමේ ඒකකය "කිලෝග්‍රෑමය" (kg) යි.—කිලෝ ග්‍රෑම යනු ස්කන්ධය මැනීමේ ඒකකයයි. මෙය කිලෝග්‍රෑමයේ ජාත්‍යන්තර ප්‍රතිරූපයෙහි ස්කන්ධ යට සමානය. (1889 හා 1901, 1 වන හා 3 වන සී. ජී. පී. එම්.)

1.3. කාලය මැනීමේ ඒකකය "තත්පරය" (s) යි.—තත්පරය යනු සීසියම් 133 පරමාණුවේ භූමි අවස්ථාවෙහි අධි සූක්ෂ්ම තලා (මට්ටම්) දෙක අතර සංක්‍රමණයට අනුරූප විකිරණයෙහි තලාවර්ත 9192 631 770 කට සමාන කාලච්ඡේදයකි. (1967, 13 වන සී. ජී. පී. එම්. 1 වන තීරණය)

1.4. විද්‍යුත් ධාරා තීව්‍රතාව මැනීමේ ඒකකය "ඇම්පියරය" (A) යි.—(ඇම්පියරය රික්තයක මීටරයක පරතරයකින් පිහිටි පරිදි තැබූ අනන්ත දිගැති නොගිණිය යුතු වෘත්ත හරස්කඩකින් යුත්, සෘජු සමාන්තර සන්නායක දෙකක් ඔස්සේ යැවූ විට ඒ සන්නායක දෙක අතරේ "දිගින් මීටරයක්" මත නිව්ටන $2 \times 10^{-7}$ කට සමාන බලයක් ඇති කරන නියත ධාරාවයි. (1946, සී. අයි. පී. එම්. 2 වන තීරණය 1948, 9 වන සී. ජී. පී. එම්. මගින් අනුමත කරන ලදී.)

1.5. උෂ්ණත්වය මැනීමේ තාප ගතික ඒකකය "කෙල්වීනය" (K) යි.—කෙල්වීනය තාප ගතික උෂ්ණත්ව ඒකකය යනු ජලයේ ත්‍රික ලක්ෂ්‍යයේ උෂ්ණත්වයෙන් 1/273.16 භාගයකි (19, 13 වන සී. ජී. පී. එම්. 4 වන තීරණය) කෙල්වීනය උෂ්ණත්ව ප්‍රාන්තරය ප්‍රකාශ කිරීම සඳහා ද යෙදේයි.

1.6. ප්‍රදීපන තීව්‍රතාව මැනීමේ ඒකකය "කැන්ඩෙලාව" (cd) යි.—කැන්ඩෙලාව යනු හර්ට්ස් $540 \times 10^{12}$ ක සංඛ්‍යාතයෙන් යුත් ඒක වර්ණ විකිරණය විමෝචනය කරන ප්‍රභවයක් යම් නියමිත දිශාවකට ස්ටෙරේඩියනයට වොට් 1/683 ක විකිරණ තීව්‍රතාවක් ඇති විකිරණය විමෝචනය කරන විට ඒ නියමිත දිශාවට එම ප්‍රභවයේ තීව්‍රතාවයි.

1.7. ද්‍රව්‍ය ප්‍රමාණය පිළිබඳ ඒකකය "මවුල" (mol) යි.—මවුල යනු කාබන් 12 හේ කිලෝ ග්‍රෑම් 0.012 ක ඇති පරමාණු සංඛ්‍යාවට සමාන මූලික භූතාර්ථ සංඛ්‍යාවක් අන්තර් ගත පද්ධතියක ද්‍රව්‍ය ප්‍රමාණයයි.

සැලකිය යුතුයි:

1. මවුල භාවිත කරන විට මූලික භූතාර්ථ කවරේදැයි සඳහන් කළ යුතු ය. මේවා පරමාණු, අණු, අයන, ඉලෙක්ට්‍රෝන, වෙනත් අංශු නැතහොත් එවැනි අංශුවල නියමිත කාණ්ඩ හෝ විය හැකි ය. (14 වන සී. ජී. පී. එම්. 1971)

2. (අ) ඉහත සඳහන් අර්ථ කථනවල යොදා ඇති වචන එම වචන සඳහා භෞතික විද්‍යාවේ යෙදෙන තේරුම ගනී.

(ආ) කිරුම් හා මිනුම් පිළිබඳ මහා සම්මේලනය යන්න වෙනුවට සී. ජී. පී. එම්. යන්න යෙදේ.

## II වන කොටස

### පරිපූරක ඒකක, ඒවායේ සංකේත සහ අර්ථ කථන

2. පරිපූරක ඒකක සමූහය :

සමතල කෝණය සඳහා "රේඩියනය" — සංකේතය (rad)

ඝණ කෝණය සඳහා "ස්ටෙරේඩියනය" — සංකේතය (sr)

2.1. තල කෝණය මැනීමේ ඒකකය.—

තල කෝණය මැනීමේ ඒකකය "රේඩියනය" (rad) වේ. රේඩියනය යනු වෘත්තයක කේන්ද්‍රය මත ශීර්ෂය ඇතිව වෘත්තයේ අරයට සමාන චාපයක් අන්තර් ඡේදනය කරන කෝණයයි.

2.2. ඝණ කෝණය මැනීමේ ඒකකය.—

ඝණ කෝණ මැනීමේ ඒකකය — "ස්ටෙරේඩියනය" යි. (සංකේතය: sr) ස්ටෙරේඩියනය යනු ගෝලයක කේන්ද්‍රය මත ශීර්ෂය ඇතිව, ඒ ගෝලයේ පෘෂ්ඨයෙන් ගෝලයේ අරයට සමාන පැත්තක් ඇති සම චතුරස්‍රයක, වර්ග ඵලයට සමාන වර්ග ඵලයක් කපන ඝණ අරයට කෝණයයි.

## III වන කොටස

3. ව්‍යුත්පන්න ඒකක ඒවායේ සංකේත සහ අර්ථ කථන

(අ) අවකාශය සහ කාලය මැනීම සම්බන්ධයෙන් ව්‍යුත්පන්න ඒකක

3.1. තරංග අංකය මැනීමේ ඒකකය.—

තරංග අංකය : මීටරයට 1 (සංකේතය : $m^{-1}$) මීටරයට 1 යනු එක් මීටරයකට සමාන තරංග ආයාමයක් ඇති එක් වර්ණ විකිරණයක තරංග අංකයයි.

$$(1m^{-1} = \frac{1}{1\ m})$$

3.2. පෘෂ්ඨික වර්ග ඵලය මැනීමේ ඒකකය.—

පෘෂ්ඨික වර්ග ඵලය : වර්ග මීටරය (සංකේතය : $m^{-2}$ ) වර්ග මීටරය යනු පැත්තක් දිගින් මීටර එකක් වන සමචතුරස්‍රක පෘෂ්ඨික වර්ග ඵලයයි.

$$(1m^{2} = 1m.\ 1m)$$

3.3. පරිමාව මැනීමේ ඒකකය .—

පරිමාව : ඝන මීටරය (සංකේතය : $m^{3}$) ඝන මීටරය යනු පැත්තක් දිගින් මීටර එකක් වන ඝනයක පරිමාවයි

$$(1m^{3} = 1m.\ 1m.\ 1m)$$

3.4 සංඛ්‍යාතය මැනීමේ ඒකකය.—

සංඛ්‍යාතය : හර්ට්ස්ය (සංකේතය : Hz) හර්ට්ස්ය යනු ආවර්ත කාලය තත්පර එකක් වන ආවර්ත සංසිද්ධියක සංඛ්‍යාතයයි.

$$(1\ Hz = 1\ s^{-1} = \frac{1}{1\ s})$$

3.5. කෝණික ප්‍රවේගය මැනීමේ ඒකකය.—

කෝණික ප්‍රවේගය : තත්පරයට රේඩියනය (සංකේතය : rad/s නැතහොත් $rad.s^{-1}$) තත්පරයට රේඩියනය යනු අචල අක්ෂයක් වටා එක් තත්පරයකදී එක් රේඩියනයක් කැරකෙන පරිදි ඒකාකාර භ්‍රමණයකින් පණ ගැන්වුණු වස්තුවක කෝණික ප්‍රවේගයයි.

$$( 1\ rad/s = \frac{1\ rad}{1\ s} )$$

3.6. කෝණික ත්වරණය මැනීමේ ඒකකය.—

කෝණික ත්වරණය : තත්පර වර්ගයට රේඩියනය (සංකේතය : $rad/s^2$ නැතහොත් $rad.s^{-2}$) තත්පර වර්ගයට රේඩියනය යනු අචල අක්ෂයක් වටා කෝණික ප්‍රවේගය එක් තත්පරයකදී තත්පරයට එක් රේඩියනයක් බැගින් විචලනය වන පරිදි ඒකාකාරව භ්‍රමණයකින් පණ ගැන්වුණු වස්තුවක කෝණික ත්වරණයයි.

$$(1\ rad/s^2 = \frac{1\ rad/s}{1 s})$$

3.7. වේගය මැනීමේ ඒකකය.—

වේගය : තත්පරයට මීටරය (සංකේතය: m/s නැතහොත් $m.s^{-1}$ තත්පරයට මීටරය යනු එක් තත්පරයකදී මීටරයක දුරක් ගෙවා යන පරිදි ඒකාකාර චලනයකින් පණ ගැන්වුණු වස්තුවක වේගයයි.

$$( 1\ m/s = \frac{1\ m}{1\ s})$$

3.8. ත්වරණය මැනීමේ ඒකකය.—

ත්වරණය : තත්පර වර්ගයට මීටරය (සංකේතය : $m/s^2$ නැතහොත් ; $m.s^{-2}$) තත්පර වර්ගයට මීටරය යනු වේගය එක් තත්පරයකට තත්පරයට මීටර එක බැගින් විචලනය වන පරිදි ඒකාකාර චලිතයකින් පණ ගැන්වුණු වස්තුවක ත්වරණයයි.

$$(1\ m/s^2 = \frac{1\ m/s}{1s} )$$

3.9. භ්‍රමණ සංඛ්‍යාතය මැනීමේ ඒකකය.—

භ්‍රමණ සංඛ්‍යාතය: සෘණ එකෙහි බලයට නැංවුණු තත්පරය (සංකේතය : $s^{-1}$) සෘණ එකෙහි බලයට නැංවුණු තත්පරය යනු එක් තත්පරයකදී එක් සම්පූර්ණ පරිභ්‍රමණයක් උපදවන ඒකාකාර භ්‍රමණ චලනයක භ්‍රමණ සංඛ්‍යාතයයි.

$$(1\ s^{-1}\ \frac{1}{1\ s} )$$

3.10. ප්‍රකාශ පද්ධතියක බලය.—

ප්‍රකාශ පද්ධතියක බලය : ඩයොප්ටරය (සංකේතය : $m^{-1}$ ) ඩයොප්ටරය යනු වර්තන අංකය එක ලෙස ඇති මාධ්‍යයකදී එක් මීටරයක නාභීය දුරක් ඇති ප්‍රකාශ පද්ධතියක බලයයි.

$$( 1m^{-1} = \frac{1}{1\ m} )$$

**(ආ) යාන්ත්‍රික විද්‍යාව හා සම්බන්ධ ව්‍යුත්පන්න ඒකක**

**3.11. රේඛීය ඝනත්වය මැනීමේ ඒකකය.—**

රේඛීය ඝනත්වය: මීටරයට කිලෝ ග්‍රෑමය (සංකේතය: kg/m නැතහොත් $kg.m^{-1}$ )

මීටරයට කිලෝ ග්‍රෑමය යනු මීටර ඒකක් දිග සහ කිලෝ ග්‍රෑම් ඒකක ස්කන්ධයක් ඇති ඒකාකාර හරස්කඩකින් යුක්ත වන සම ජාතිය වස්තුවක රේඛීය ඝනත්වයයි.

$$(1\ kg/m = \frac{1\ kg}{1\ m})$$

**3.12. පෘෂ්ඨික ඝනත්වය මැනීමේ ඒකකය.—**

පෘෂ්ඨික ඝනත්වය : වර්ග මීටරයට කිලෝ ග්‍රෑම් (සංකේතය : $kg/m^2$ නැතහොත් $kg.m^{-2}$ ) වර්ග මීටරයට කිලෝ ග්‍රෑමය යනු වර්ග මීටර ඒකක වර්ග ඵලයක් සහ කිලෝ ග්‍රෑම් ඒකක ස්කන්ධයක් ඇති ඒකාකාර ඝනකමකින් යුක්ත වන සමජාතිය වස්තුවක පෘෂ්ඨික ඝනත්වයයි.

$$(1\ kg/m^2 = \frac{1\ kg}{1m^2})$$

**3.13. ඝනත්වය මැනීමේ ඒකකය.—**

ඝනත්වය (ස්කන්ධ ඝනත්වය) ඝන මීටරයට කිලෝ ග්‍රෑම් (සංකේතය $kg/m^3$ නැතහොත් $kg.m^{-3}$) ඝන මීටරයට කිලෝ ග්‍රෑමය යනු ඝන මීටර ඒකක පරිමාවක් සහ කිලෝ ග්‍රෑම් ඒකක ස්කන්ධයක් ඇති සමජාතිය වස්තුවක ඝනත්වය යි.

$$(1\ kg/m^3 = \frac{1\ kg}{1m^3})$$

**3.14. සාන්ද්‍රණය මැනීමේ ඒකකය.—**

සාන්ද්‍රණය : ඝන මීටරයට කිලෝ ග්‍රෑමය (සංකේතය : $kg/m^3$ නැතහොත් $kg.m^{-3}$ ) ඝන මීටරයට කිලෝ ග්‍රෑමය යනු ද්‍රව්‍යයක කිලෝ ග්‍රෑම් ඒකක ස්කන්ධයක් අඩංගුව ඇති ඝන මීටර ඒකක සම්පූර්ණ පරිමාවකින් යුක්ත සම ජාතිය ද්‍රාවණයක සාන්ද්‍රණයයි.

$$(1\ kg/m^3 = \frac{1\ kg}{1m^3})$$

**3.15. බලය මැනීමේ ඒකකය.—**

බලය : නිව්ටනය (සංකේතය : N ) නිව්ටනය යනු ස්කන්ධය කිලෝ ග්‍රෑම් ඒකක් වන වස්තුවක් මත වර්ග තත්පරයකට මීටර් ඒකක් ත්වරණය ඇති කරන බලයයි.

$$(1\ N = 1\ kg.\ 1\ m/s^2)$$

**3.16. බල ඝූර්ණය මැනීමේ ඒකකය.—**

බල ඝූර්ණය : නිව්ටන් මීටරය (සංකේතය :N.m ) නිව්ටන් මීටරය යනු නිව්ටන් ඒකක බලයක් වස්තුවක් කැරකෙන අචල අක්ෂයක සිට මීටර ඒකක අභිලම්බක දුරකින් බලපාන විට ඇති කරන බල ඝූර්ණයයි.

$$(1\ N.m = 1.\ N.\ 1\ m)$$

3.17. පීඩනය, ප්‍රත්‍යා බලය මැනීමේ ඒකකය.—

පීඩනය, ප්‍රත්‍යා බලය : පැස්කලය (සංකේතය : Pa ) පැස්කලය යනු වර්ග මීටර එකක වර්ග ඵලයක් ඇති තල පෘෂ්ඨයක් මත ක්‍රියාකරමින් එම වර්ග ඵලය මත පෘෂ්ඨයට ලම්භකව නිව්ටන එකක බලයක් පාන ඒකාකාර පීඩනයයි. එය වර්ග මීටර එකක වර්ග ඵලයක් ඇති තල පෘෂ්ඨයක් මත ක්‍රියාකරමින් එම පෘෂ්ඨය මත නිව්ටන් එකක බලයක් පාන ප්‍රත්‍යා බලයද වේ.

$$(1\ \text{Pa} = \frac{1\ \text{N}}{1\ \text{m}^2})$$

3.18. ගතික දුස්ස්‍රාවිතාව මැනීමේ ඒකකය.—

ගතික දුස්ස්‍රාවිතාව : පැස්කල් තත්පරය (සංකේතය : Pa.s ) පැස්කල් තත්පරය යනු යම් සමජාතීය තරලයක් එහි එක් මීටරයක දුරකින් වෙන් වී ඇති සමාන්තර තල දෙකක් අතර ප්‍රවේග අන්තරයක් ඇති කල්හි එක් වර්ග මීටරයක තල පෘෂ්ඨයක ඒකාකාර රේඛීය චලනයක් මගින් එක් නිව්ටනයක මන්දන බලයක් ඇතිවන පරිදි වේ නම් එම තරලයෙහි ගතික දුස්ස්‍රාවිතාවයයි.

$$(1\ \text{Pa. s} = \frac{1\ \text{pa. 1m}}{1\ \text{m/s}})$$

3.19. ප්‍රගති දුස්ස්‍රාවිතාව මැනීමේ ඒකකය.—

ප්‍රගති දුස්ස්‍රාවිතාව : තත්පරයට වර්ග මීටර (සංකේතය : $m^2/s$ නැතහොත් $m^2.s^-$ ) තත්පරයට වර්ග මීටරය යනු පැස්කල් තත්පරයක ගතික දුස්ස්‍රාවිතාවක් ඇති ඝන මීටරයට කිලෝ ග්‍රෑම් එකක ඝනත්වයෙන් යුත් තරලයක ප්‍රගති දුස්ස්‍රාවිතාවයයි.

$$(1\ \text{m}^2/\text{s} = \frac{1\ \text{Pa. s}}{1\ \text{kg/m}^3})$$

3.20. පෘෂ්ඨික ආතතිය මැනීමේ ඒකකය.—

පෘෂ්ඨික ආතතිය : මීටරයට නිව්ටන් (සංකේතය : N/m නැතහොත් $N.m^{-1}$) මීටරයට නිව්ටනය යනු යම් ද්‍රවයක් වටා ඇති ද්‍රව්‍යයෙන් ඒ ද්‍රවය වෙන් වන ද්‍රව පෘෂ්ඨය මත එක් මීටරයක දුරක් පුරා එක් නිව්ටනයක බලයක් ක්‍රියා කරන විට උපදින පෘෂ්ඨික ආතතියයි.

$$(1\text{N/m} = \frac{1\ \text{N}}{1\ \text{m}})$$

3.21. කාර්යය, ශක්තිය, තාප ප්‍රමාණම මැනීමේ ඒකකය.—

කාර්යය, ශක්තිය, තාප ප්‍රමාණය : ජූලය (සංකේතය : J) ජූලය යනු එක් නිව්ටනයක බලයක උපයෝගී ලක්ෂ්‍යය ඒ බලයේ දිශාවට එක් මීටරයකින් විස්ථාපනය වන විට කැරෙන කාර්යයයි.

$$(1\ \text{J} = 1\ \text{N}.\ 1\ \text{m})$$

3.22. ජවය, ශක්තිය ගැලීමේ සීඝ්‍රතාව, තාපය ගැලීමේ සීඝ්‍රතාව මැනීමේ ඒකකය.—

ජවය, ශක්තිය ගැලීමේ සීඝ්‍රතාව, තාපය ගැලීමේ සීඝ්‍රතාව : වොටය (සංකේතය; W) වොටය යනු තත්පරයට එක් ජූලයකට සමාන ශක්ති උත්පාදනයක් ඇති කරන ජවයයි.

$$(1\ \text{W} = \frac{1\ \text{J}}{1\ \text{s}})$$

**6.23. පරිමා ගැලීමේ සීඝ්‍රතාව මැනීමේ ඒකකය.—**

**පරිමා ගැලීමේ සීඝ්‍රතාව :** තත්පරයට ඝන මීටරය (සංකේතය : $m^3/s$ නැතහොත් $m^3 s^{-1}$) තත්පරයට ඝන මීටරය යනු සලකා බලනු ලබන්න හරස්කඩ හරහා එක් තත්පරයට එක් ඝන මීටරයක පරිමාව ඇති ද්‍රව්‍ය ප්‍රමාණයක් ගලා යන පරිදි වන ඒකාකාර ගැලීමක පරිමා ගැලීමේ සීඝ්‍රතාවයි

$$\left(1\ m^3/s = \frac{1\ m^3}{1\ s}\right)$$

**6.24. ස්කන්ධ ගැලීමේ සීඝ්‍රතාව මැනීමේ ඒකකය.—**

**ස්කන්ධ ගැලීමේ සීඝ්‍රතාව :** තත්පරයට කිලෝග්‍රෑමය (සංකේතය : $kg/s$ නැතහොත් $kg.s^{-1}$) තත්පරයට කිලෝග්‍රෑමය යනු සලකා බලනු ලබන හරස්කඩ හරහා එක් තත්පරයකට එක් කිලෝග්‍රෑමයක ස්කන්ධයක් ඇති ද්‍රව්‍ය ප්‍රමාණයක් ගලා යන පරිදි වන ඒකාකාර ගැලීමක ස්කන්ධ ගැලීමේ සීඝ්‍රතාවයයි.

$$\left(1\ kg/s = \frac{1\ kg}{1\ s}\right)$$

**6.25. විශිෂ්ට පරිමාව මැනීමේ ඒකකය.—**

**විශිෂ්ට පරිමාව :** කිලෝග්‍රෑමයට ඝන මීටරය (සංකේතය: $m^3/kg$ නැතහොත් $m^3.kg^{-1}$) කිලෝග්‍රෑමයට ඝන මීටරය යනු එක් ඝන මීටරයක පරිමාවක් එක් කිලෝග්‍රෑමයක ස්කන්ධයක් ඇති සමජාතීය වස්තුවක විශිෂ්ට පරිමාවයි

$$\left(1 m^3/kg = \frac{1\ m^3}{1\ kg}\right)$$

**(ඈ) තාපය සම්බන්ධ ව්‍යුත්පන්න ඒකක.**

**6.26. එන්ට්‍රොපිය මැනීමේ ඒකකය.—**

එන්ට්‍රොපිය : කෙල්වීනයට ජූලය (සංකේතය : $J/K$ නැතහොත් $J.K^{-1}$) කෙල්වීනයට ජූලය යනු අප්‍රතිවර්ත්‍ය විපර්යාසයක් සිදු නොවේ නම් එක් කෙල්වීනයක නියත උෂ්ණත්වයේදී එක් ජූලයක තාප ප්‍රමාණයක් ලබන පද්ධතියක එන්ට්‍රොපියයි.

$$\left(1\ J/K = \frac{1\ J}{1\ K}\right)$$

**6.27. විශිෂ්ට එන්ට්‍රොපිය මැනීමේ ඒකකය.—**

**විශිෂ්ට එන්ට්‍රොපිය :** කිලෝ ග්‍රෑම් කෙල්වීනයට ජූලය (සංකේතය : $J/kg.K$ නැතහොත් $J.kg^{-1}.K^{-1}$) කිලෝග්‍රෑම් කෙල්වීනයට ජූලය යනු අප්‍රතිවර්ත්‍ය විපර්යාසයක් සිදුනොවේ නම්, එක් කෙල්වීනයක නියත උෂ්ණත්වයේදී එක් ජූලයකට සමාන තාප ප්‍රමාණයක් ලබන, එක් කිලෝග්‍රෑමයක ස්කන්ධයෙන් යුත් සමජාතීය පද්ධතියක විශිෂ්ට එන්ට්‍රොපියයි.

$$\left(1\ J/kg.K = \frac{1J}{1\ kg.\ 1K}\right)$$

**6.28. තාප ධාරිතාව මැනීමේ ඒකකය .—**

**තාප ධාරිතව :** කෙල්වීනයට ජූලය (සංකේතය : $J/K$ නැතහොත් $J.K^{-1}$ කෙල්වීනයට ජූලය යනු එක් ජූලයකට සමාන තාප ප්‍රමාණයක් ලබා ගත් විට තාප ගතික උෂ්ණත්වයෙහි එක් කෙල්වීනයක වැඩිවීමක් උපදවන සමජාතීය වස්තුවක තාප ධාරිතාවයි.

$$\left(1\ J/K = \frac{1J}{1\ K}\right)$$

**3.29. විශිෂ්ට තාපධාරිතාව මැනීමේ ඒකකය .—**

විශිෂ්ට තාප ධාරිතාව : කිලෝග්‍රෑමයකට කෙල්වීනයට ජූලය : (සංකේතය $J/kg.K$ නැතහොත් $J.kg^{-1}K^{-1}$) කිලෝග්‍රෑම කෙල්වීනයට ජූලය යය එක් ජූලයක තාප ප්‍රමාණයක් ලබාගත් විට උෂ්ණත්වයෙහි එක් කෙල්වීනය නැගීමක් ඇති කරන, එක් කිලෝග්‍රෑමයක ස්කන්ධයෙන් යුත්, සමජාතීය වස්තුවක විශිෂ්ට තාප ධාරිතාවයි.

$$(1\ J/kg.K = \frac{1J}{1\ kg.\ 1\ K})$$

**3.30. ගුප්ත තාපය මැනීමේ ඒකකය .—**

ගුප්ත තාපය : කිලෝග්‍රෑමයට ජූල (සංකේතය : $J/kg$ නැතහොත් $J.kg^{-1}$) කිලෝග්‍රෑමයට ජූල් යනු එක් කලාපයක් වෙනත් කලාපයකට පරිවර්තනය කිරීම සඳහා පරිවර්තනය වන උෂ්ණත්වයේදී එක් කිලෝග්‍රෑමයක ද්‍රව්‍ය ප්‍රමාණයකින් හුවමාරු වන තාපයයි.

$$(1\ J/kg = \frac{1\ J}{1\ kg})$$

**3.31. තාප සන්නායකතාව මැනීමේ ඒකකය.—**

තාප සන්නායකතාව මීටරයට කෙල්වීනයට වොටය: (සංකේතය:$W/m.K$ නැතහොත් $W.m^{-1}K^{-1}$) මීටරයට කෙල්වීනයට වොටය යනු එක් කෙල්වීනයක උෂ්ණත්ව අන්තරයකින් එක් මීටරයකින් දුරස්ව පිහිටි එක් වර්ග මීටරයක පෘෂ්ඨයෙන් යුත් සමාන්තර තල දෙකක් අතර වොටයක තාප ගැලුම් සීඝ්‍රතාවක් ඇති කරන සමජාතීය වස්තුවක තාප සන්නායකතාවයි.

$$(1\ W/m.K = \frac{1\ W/m^2}{1\ K/1\ m})$$

**(ඈ) විද්‍යුතය සහ චුම්භකත්වය හා සම්බන්ධ ව්‍යුත්පන්න ඒකක.**

**3.32. විද්‍යුත් ප්‍රමාණය මැනීමේ ඒකකය.—**

විද්‍යුත් ප්‍රමාණය, විද්‍යුත් ආරෝපණය : කූලෝමය (සංකේතය : $C$ ) කූලෝමය යනු ඇම්පියර් එකක විද්‍යුත් ධාරාවක් මගින් තත්පර එකකදී ගෙන යන විද්‍යුත් ප්‍රමාණයයි.

$$(1\ C = 1A.\ 1s = 1A.s)$$

**3.33. විද්‍යුත් විභවය, විද්‍යුත් ආතතිය, විද්‍යුත් ගාමක බලය මැනීමේ ඒකකය.—**

විද්‍යුත් විභවය, විද්‍යුත් ආතති, විද්‍යුත් ගාමක බලය, වෝල්ටය: (සංකේතය: $V$ ) වෝල්ටය යනු යම් විද්‍යුත් ගාමක බල ප්‍රභවයක් නොවන සන්නායක කම්බියක, ඇම්පියරයක ධාරාවක් ඇතිවිට එහි යම් ලක්ෂ්‍ය දෙකක් අතර ප්‍රදේශයෙහි එමගින් ශක්තිය ඇති කිරීමේ සීඝ්‍රතාව වොටයකට සමාන වන්නේ නම් එම ලක්ෂ්‍ය දෙක අතර විභව අන්තරයයි.

$$(1\ V = \frac{1\ W}{1\ A})$$

**3.34. විද්‍යුත් ක්ෂේත්‍ර ප්‍රබලතාව මැනීමේ ඒකකය.—**

විද්‍යුත් ක්ෂේත්‍ර ප්‍රබලතාවය: මීටරයට වෝල්ටය (සංකේතය: $V/m$ නැතහොත් $V.m^{-1}$) මීටරයට වෝල්ටය යනු එක් කූලෝමයක විද්‍යුත් ප්‍රමාණයකින් ආරෝපිත වස්තුවක් මත එක් නිව්ටනයක බලයක් මෙහෙයවන විද්‍යුත් ක්ෂේත්‍රයෙහි ප්‍රබලතාවයි.

$$(1\ V/m = \frac{1N}{1C})$$

3.35. විද්‍යුත් ආරෝපණ ඝනත්වය මැනීමේ ඒකකය.—

විද්‍යුත් ආරෝපණ ඝනත්වය : ඝන මීටරයට කූලෝමය (සංකේතය : $C/m^3$ නැතහොත් $C.m^{-3}$ ) ඝන මීටරයට කූලෝමය යනු එක් ඝන මීටරයක පරිමාවෙන් යුත්, එක් කූලෝමයක ආරෝපණයක් ඇති, සමජාතීය ස්කන්ධයක හෝ පද්ධතියක හෝ විද්‍යුත් ආරෝපණ ඝනත්වයයි.

$$(1\,C/m^3 = \frac{1C}{1\,m^3})$$

3.36. විද්‍යුත් ස්‍රාව ඝනත්වය මැනීමේ ඒකකය.—

විද්‍යුත් ස්‍රාව ඝනත්වය: වර්ග මීටරයට කූලෝමය:(සංකේතය: $C/m^2$ නැතහොත් $C.m^{-2}$ ) වර්ග මීටරයට කූලෝමය යනු අනන්ත දිගින් යුත් එකට එකක් සාමන්තර තහඩු සහිත කන්ඩෙන්සරයක් හෝ තහඩුවේ එක් වර්ග මීටරයක වර්ග ඵලයකට එක් කූලෝමයකට සමාන විද්‍යුත් ප්‍රමාණයකින් ආරෝපණය කළ විට එහි ඇති වන විද්‍යුත් ස්‍රාව ඝනත්වයයි.

$$(1\,C/m^2 = \frac{1C}{1\,m^2})$$

3.37. විද්‍යුත් ප්‍රතිරෝධය මැනීමේ ඒකකය.—

විද්‍යුත් ප්‍රතිරෝධය : ඕමය (සංකේතය : $\Omega$ ) ඕමය යනු විද්‍යුත් ගාමක බලයකට ලක් නොවූ යම් සන්නායකයක ලක්ෂ්‍ය දෙකක් අතර එක් වෝල්ටයක නියත විභව අන්තරයක් යෙදූ විට ඒ සන්නායකයේ එක් ඇම්පියරයක ධාරාවක් උපදී නම් සන්නායකයෙහි ඒ ලක්ෂ්‍ය දෙක අතර විද්‍යුත් ප්‍රතිරෝධයයි,

$$(1\Omega = \frac{1V}{1A})$$

3.38. සන්නායකතාවය මැනීමේ ඒකකය.—

සන්නායකතාව : සිමන්සය (සංකේතය :S ) සිමන්සය යනු එක් ඕමයක විද්‍යුත් ප්‍රතිරෝධයක් ඇති සන්නායකයක සන්නායකතාවයි.

$$(1S = 1\Omega^{-1} \quad \frac{}{1\Omega})$$

3.39. විද්‍යුත් ධාරිතාව මැනීමේ ඒකකය.—

විද්‍යුත් ධාරිතාව : පැරඩය (සංකේතය :F ) පැරඩය යනු කූලෝම් එකක විද්‍යුත් ප්‍රමාණයකින් ආරෝපණය කළ විට තහඩු අතරෙහි වෝල්ටයක විභව අන්තරයක් ඇති වන ධාරිත්‍රකයක ධාරිතාවයි.

$$(1F = \frac{1C}{1V})$$

3.40. පාර වෛද්‍යතාව මැනීමේ ඒකකය .—

පාර වෛද්‍යතාව මීටරයට පැරඩය (සංකේතය : $F/m$ නැතහොත් $F.m^{-1}$) මීටරයට පැරඩය යනු එක් මීටරයකින් දුරස්ථ පිහිටි සමාන්තර තහඩු දෙකක වර්ග මීටරයක වර්ග ඵලයකට එක් පැරඩයක ධාරණතාවක් දෙන මාධ්‍යයෙහි පාරවෛද්‍යතාවයි.

$$(1\,F/m = \frac{1F}{1\,m})$$

3.41. විද්‍යුත් ප්‍රේරතාව මැනීමේ ඒකකය.—

විද්‍යුත් ප්‍රේරතාව : හෙන්රිය (සංකේතය : H) හෙන්රිය යනු තත්පරයකට ඇම්පියරය බැගින් ධාරාව ඒකාකාරව විචල වන විට වෝල්ටයක විද්‍යුත් ගාමක බලයක් ඇති වන පරිපථයක ප්‍රේරතාවයි.

$$(1\,H = \frac{1V.1S}{1A})$$

3.42. පාරගම්‍යතාව මැනීමේ ඒකකය.—

පාරගම්‍යතාව : මීටරයට හෙන්රිය (සංකේතය : H/m නැතහොත් $H.m^{-1}$) මීටරයට හෙන්රිය යනු එක්වර්ග මීටරයක වර්ග ඵලයක් අන්තර්ගත කරන්නාවූ ද එක් මීටරයක දිගින් යුක්ත වූද එක් හෙන්රියක ප්‍රේරතාවක් දෙන්නාවූද තල ස්ථර සන්නායක එක් තනි වටයකින් වට වූ ද්‍රව්‍යයක පාරගම්‍යතාවයි.

$$(1H/m = \frac{1H}{1m})$$

3.43. චුම්බක ස්‍රාව මැනීමේ ඒකකය.—

චුම්බක ස්‍රාවය, චුම්බක ප්‍රේරන ස්‍රාවය : වෙබරය (සංකේතය : Wb) වෙබරය යනු එක් වටයකින් යුතු පරිපථයක් තුළින් පිහිටන්නා වූද තත්පර එකක කාලයක් තුළ ඒකාකාර සීඝ්‍රතාවයකින් ශුන්‍ය දක්වා අඩු කිරීම නිසා එහි වෝල්ට් එකක විද්‍යුත් ගාමක බලයක් නිපදවන්නා වූ ද චුම්බක ස්‍රාව ප්‍රමාණයයි.

$$(1\,Wb = 1\,V.\,1\,s)$$

3.44. චුම්බක ප්‍රේරතාව මැනීමේ ඒකකය.—

චුම්බක ප්‍රේරතාව, චුම්බක ස්‍රාව ඝනත්වය : ටෙස්ලා (සංකේතය T) ටෙස්ලා යනු එක් වර්ග මීටරයක පෘෂ්ඨයක් මත අභිලම්බ ලෙස ව්‍යාප්ත පෘෂ්ඨය හරහා එක් වෙබරයක මුළු චුම්බක ස්‍රාවයක් උපදවන ඒකාකාර චුම්බක ස්‍රාවයයි.

$$(1\,T = \frac{1\,Wb}{1\,m^2})$$

3.45. චුම්බක ගාමක බලය මැනීමේ ඒකකය.—

චුම්බක ගාමක බලය : ඇම්පියරය (සංකේතය : A) ඇම්පියරය යනු ඇම්පියර් එකක විද්‍යුත් ධාරාවක් ගලායන විද්‍යුත් සන්නායකයක් වටා එක් වටයක් පමණක් පිහිටන පියවි කවයක් ඔස්සේ ගොඩනැගෙන චුම්බක ගාමක බලයයි.

3.46. චුම්බක ක්ෂෙත්‍ර ප්‍රබලතාව මැනීමේ ඒකකය.—

චුම්බක ක්ෂෙත්‍ර ප්‍රබලතාව : මීටරයට ඇම්පියරය (සංකේත : A/m නැතහොත් $A.m^{-1}$) මීටරයට ඇම්පියරය යනු අනන්ත දිගින් ද නොගිනිය හැකි තරමේ වෘත්ත හරස්කඩකින් යුත් ඍජු සන්නායකයක පවත්වා ගනු ලබන එක් ඇම්පියරයක විද්‍යුත් ධාරාවක් මගින් එම සන්නායකය අක්ෂය ලෙස ඇති එක් මීටරයක පරිධියෙන් යුත් වෘත්තයක පරිධිය දිගේ රික්තයේ දී උපදවෙන චුම්බක ක්ෂෙත්‍රයේ ප්‍රබලතාවයි.

$$(1\,A/m = \frac{1\,A}{1\,m})$$

**3.47. ධාරා ඝනත්වය මැනීමේ ඒකකය.—**

ධාරා ඝනත්වය : වර්ග මීටරයට ඇම්පියරය (සංකේතය: $A/m^2$ නැතහොත් $A.m^{-2}$) වර්ග මීටරයට ඇම්පියරය යනු යම් රේඛීය සන්නායකයක දිශාවට ලම්භ එහි එක් වර්ග මීටරයකට සමාන හරස්කඩක් හරහා එක් ඇම්පියරයක තීව්‍රතාවෙන් යුත් විද්‍යුත් ධාරාවක් ගලා යන විට එම රේඛීය සන්නායකයෙහි ධාරා ඝනත්වයයි.

$$\left(1A/m^2 = \frac{1A}{1m^2}\right)$$

**ආ) විද්‍යුත් චුම්භක විකිරණය සහ ආලෝකය හා සම්බන්ධ ව්‍යුත්පන්න ඒකක :**

**3.48. විකිරණ තීව්‍රතාව මැනීමේ ඒකකය.—**

විකිරණ තීව්‍රතාව : ස්ටෙරේඩියනයට වොටය. (සංකේතය : W/sr නැතහොත් $W.sr^{-1}$) ස්ටෙරේඩියනයට වොටය යනු එක් ස්ටෙරේඩියනයක ඝන කෝණයක් තුළ එක් වොටයක විකිරණ ශ්‍රාවයක් ඒකාකාර ලෙස විහිදුවන ලක්ෂ්‍ය ප්‍රභවයක විකිරණ තීව්‍රතාවයි.

$$\left(1\ W/sr = \frac{1W}{1\ sr}\right)$$

**3.49. ප්‍රවිකිරණතාව මැනීමේ ඒකකය.—**

ප්‍රවිකිරණතාව : වර්ග මීටරයට වොටය (සංකේතය : $W/m^2$ නැතහොත් $W,m^{-1}$) වර්ග මීටරයට වොටය යනු ලක්ෂ්‍ය ප්‍රභවයක් අන්තර්ගත කරන එක් වර්ග මීටරයක පෘෂ්ඨයකින් යුක්තව ඛණ්ඩයක් පුරා ඒකාකාර ව්‍යාප්ත වුණු එක් වොටයක විකිරණ ශ්‍රාවයකින් ඇති කෙරෙන ප්‍රවිකිරණතාවයි.

$$\left(W/m^2 = \frac{1W}{{}^{2}1m}\right)$$

**3.50. විකිරණතාව මැනීමේ ඒකකය.—**

විකිරණතාව: වර්ග මීටර ස්ටෙරේඩියනයට වොටය: (සංකේතය : $W/m^2 sr$ $W.m^{-2}Sr^{-1}$) වර්ග මීටර ස්ටෙරේඩියනයට වොටය යනු ප්‍රක්ෂිප්ත වර්ග ඵලයක වර්ග මීටරයට ස්ටෙරේඩියනයකට එක් වොටය බැගින් විකිරණය කරන ප්‍රභවයක විකිරණතාවයි.

$$\left(1\ W/m^2\ sr = \frac{1W}{1\ m^2 . 1\ sr}\right)$$

**3.51. දීප්තතාවය මැනීමේ ඒකකය.—**

දීප්තතාවය : වර්ග මීටරයට කැන්ඩෙලා (සංකේතය : $cd/m^2$ නැතහොත් $cd.m^{-2}$ ) වර්ග මීටරයට කැන්ඩෙලාව යනු කැන්ඩෙලාවක දීප්ත තීව්‍රතාවක්ද වර්ග මීටරයක වර්ග ඵලයක්ද ඇති ප්‍රභවයක තලයට අභිලම්බ දිශාවේ දීප්තතාවයි,

$$\left(1\ cd/m^2 = \frac{1\ cd}{1\ m^3}\right)$$

**3.52. දීප්ත ශ්‍රාවය මැනීමේ ඒකකය .—**

දීප්ත ශ්‍රාවය : ලුමනය (සංකේතය : lm ) ලුමනය යනු දීප්ත තීව්‍රතාව කැන්ඩෙලාවක් වන ඒකාකාරී ලක්ෂ්‍ය ප්‍රභවයකින් ස්ටෙරේඩියන් ඒකක ඝන කෝණයකින් විමෝචනය කරන දීප්ත ශ්‍රාවයයි.

$$(1\ lm = 1\ cd.\ 1\ sr)$$

**3.53. ප්‍රදීපනය මැනීමේ ඒකකය.—**

ප්‍රදීපනය : ලක්ස්ය (සංකේතය : lx ) ලක්ස්ය යනු ලූමනයක දීප්ත ස්‍රාවයක සංඝටයක වර්ගමීටර එකක් මත ඒකාකාරීව විසිරී පවතින ලෙස වැටෙන විට එම පෘෂ්ඨයේ ප්‍රදීපනයයි.

$$(1\ lx = \frac{1\ lm}{1\ m^2})$$

**(ඊ) අයනීකරණ විකිරණය හා සම්බන්ධ ව්‍යුත්පන්න ඒකක :**

**3.54. විකිරණශීල සක්‍රියතාව මැනීමේ ඒකකය.—**

විකිරණශීල ප්‍රභවයක සක්‍රියතාව : බෙකරලය (සංකේතය : Bq ) බෙකරලය යනු තත්පරයකට න්‍යෂ්ටික පරිණාමයක් නැතහොත් සංක්‍රමණයක් ඇති වන විකිරණශීල ප්‍රභවයක සක්‍රියතාවයි.

$$(1\ Bq = \frac{1}{1s})$$

**3.55. අවශෝෂණ මාත්‍රාව මැනීමේ ඒකකය.—**

අවශෝෂණ මාත්‍රාව : ග්‍රේය (සංකේතය : Gy) ග්‍රේය යනු නියත අඛණ්ඩ ශක්ති ප්‍රවාහයක් වාස්සන අයනීකරණ විකිරණයකින් එක් ජූලයක ශක්ති ප්‍රමාණයක් ලැබෙන එක් කිලෝ ග්‍රෑමයක ස්කන්ධයකින් යුත් ද්‍රව්‍ය මූල ඛණ්ඩයකට අව ශෝෂණය වන්නා වූ මාත්‍රාවයි.

$$(1\ Gy = \frac{1\ J}{1\ kg})$$

**3.56. නිරාවරණය මැනීමේ ඒකකය.—**

නිරාවරණය කිලෝ ග්‍රෑමයකට කූලෝමය : (සංකේතය : C/kg නැතහොත් $C.kg^{-1}$ ) කිලෝ ග්‍රෑමයට කූලෝමය යනු එක් කිලෝ ග්‍රෑමයක ස්කන්ධයෙන් යුත් වාත ප්‍රමාණයක එක් කූලෝමයක මුළු විද්‍යුත් ආරෝපණයක් සහිත එකම ලකුණින් යුත් අයන ඇති කළ හැකි ෆෝටෝනික අයනීකරණ විකිරණයක නිරාවරණයයි. මෙහි දී ශක්ති ප්‍රවාහය සලකා බලනු ලබන වාත ප්‍රමාණය පුරා ඒකාකාරයි.

$$(1\ C/kg = \frac{1\ C}{1\ kg})$$

**(උ) භෞතික රසායන විද්‍යාව සහ අනුක භෞතික විද්‍යාව හා සම්බන්ධ ව්‍යුත්පන්න ඒකක**

**3.57. සාන්ද්‍රණය මැනීමේ ඒකකය : (ද්‍රව්‍ය ප්‍රමාණය).—**

සාන්ද්‍රණය (ද්‍රව්‍ය ප්‍රමාණය) : ඝන මීටරයට මවුල (සංකේතය ; mol/m නැතහොත් $mol.m^{-3}$ ) ඝන මීටරයට මවුලය යනු ද්‍රව්‍යයක එක් මවුල එකක් අඩංගුව ඇති ඝන මීටර ඒකක සම්පූර්ණ පරිමාවකින් යුත් සමජාතීය ද්‍රාවණයක සාන්ද්‍රණයයි.

$$(1\ mol/m^3 = \frac{1\ mol}{1\ m^3})$$

**3.58. මවුල ශක්තිය මැනීමේ ඒකකය.—**

මවුල ශක්තිය, මවුලයට ජූලය (සංකේතය J/mol නැතහොත් $Jmol^{-1}$) මවුලයට ජූලය යනු ද්‍රව්‍යයක මවුල ඒකක ජූල් එකක ශක්ති ප්‍රමාණයක් ඇති විට මවුල ශක්තියයි.

$$\left( 1\ J/mol = \frac{1J}{1\ mol} \right)$$

**3.59. මවුල එන්ට්‍රෝපිය මැනීමේ ඒකකය.—**

මවුල එන්ට්‍රෝපිය : මවුල කෙල්විනයට ජූල් (සංකේතය : J/mol. K නැතහොත් $J.mol^{-1}K^{-1}$) මවුල කෙල්විනයට ජූලය යනු කෙල්වින් එකක නියත තාපගතික උෂ්ණත්වයක පවතිමින් අප්‍රතිවර්ත්‍ය විපර්යාසයක් සිදු නොවී, ජූල් එකක, තාප ප්‍රමාණයක් ලබන මවුල එකක ද්‍රව්‍ය ප්‍රමාණයක් ඇති පද්ධතියක මවුල එන්ට්‍රෝපියයි.

$$\left( 1J/molK = \frac{1J}{1\ mol.\ 1K} \right)$$

## IV වන කොටස

**එස්. අයි. උපසර්ග වල නාම, ගුණක සාධක, සංකේත සහ එස්. අයි. උප සර්ග භාවිතයෙ පිළිබඳ මූලධර්ම**

4.1. එස්. අයි. ඒකකවල දශම ගුණකාරකයන්, උපගුණකාරයන් සෑදෙන්නේ අදාළ එස්. අයි. ඒකක ගුණ කිරීම සඳහා මීලඟ නියමිතෙහි සඳහන් දශම සංඛ්‍යාත්මක සාධක යෙදීමෙනි.

4.2. එස්. අයි. ඒකකවල දශම ගුණාකාර වලත්, උපගුණාකාර වලත් [illegible] සෑදෙන්නේ දශම සංඛ්‍යාත්මක සාධක නම් කරන එස්. අයි. උපසර්ග එකතු වීමෙනි.

| ගුණකසාධක | | | එස්. අයි. උපසර්ග | | සංකේත |
|---|---|---|---|---|---|
| 1 000 000 000 000 000 000 | — | $10^{18}$ | = එක්සා | ... | E |
| 1 000 000 000 000 000 | — | $10^{15}$ | = පෙටා | ... | P |
| 1 000 000 000 000 | — | $10^{12}$ | = ටෙරා | ... | T |
| 1 000 000 000 | — | $10^{9}$ | = ගිගා | ... | G |
| 1 000 000 | — | $10^{6}$ | = මෙගා | ... | M |
| 1 000 | — | $10^{3}$ | = කිලෝ | ... | k |
| 100 | — | $10^{2}$ | = හෙක්ටෝ | ... | h |
| 10 | — | $01^{1}$ | = ඩෙකා | ... | da |
| 0.1 | — | $10^{-1}$ | = ඩෙසි | ... | d |
| 0.01 | — | $10^{-2}$ | = සෙන්ටි | ... | c |
| 0.001 | — | $10^{-3}$ | = මිලි | ... | m |
| 0.000 001 | — | $10^{-6}$ | = මයික්‍රෝ | ... | μ |
| 0.000 000 001 | — | $10^{-9}$ | = නැනෝ | ... | n |
| 0.000 000 000 001 | — | $10^{-12}$ | = පිකෝ | ... | p |
| 0.000 000 000 000 001 | — | $10^{-15}$ | = ෆෙම්ටෝ | ... | f |
| 0.000 000 000 000 000 001 | — | $10^{-18}$ | = ඇටෝ | ... | a |

4.3. උපසර්ගයක් ඒ හා කෙළින්ම සම්බන්ධ නාම හා සන්ධි වී ඇති ලෙස සැලකේ.

4.4. උප සර්ගයේ සංකේත ඒකකයට ඉදිරියෙන් ඒ දෙක අතර ඉඩක් නොතබා ලිවිය යුතුයි. මින් ලැබෙන සන්දිවූ සංකේතයෙන් ඒකකයේ ගුණාකාරයේ හෝ උප ගුණාකාරයේ හෝ සංකේත ලැබෙයි. මේ නිසා ධන හෝ සෘණ හෝ බලයකට නැංවිය හැක්කාවූත් සංයුක්ත ඒකක වල සංකේත තැනීම සඳහා වෙනත් ඒකකවල සංකේත හා සන්ධි කළ හැක්කා වූත් නව ඒකක සංකේතයක් ලැබෙන පරිදි උපසර්ගයේ සංකේතය ඒ හා කෙලින්ම සම්බන්ධ ඒකකයේ සංකේතය හා සන්දි වී ඇතැයි සැලකේ.

4.5 එස්. අයි. උපසර්ග එකකට පසු එකක් යෙදීමෙන් තැනෙන සන්දි වූ උපසර්ග යෙදීමට අවසර නැත.

4.6. ස්කන්ධයෙහි, ඒකකයෙහි දශම ගුණාකාර වලත්, උප ගුණාකාර වලත් නම් හා සංකේත සෑදෙන්නේ ග්‍රෑම් යන පදයට එස්. අයි. උපසර්ග යෙදීමෙනි. ග්‍රෑම් (සංකේතය : g)

$$1g = 0.001\ kg = 10^{-3}\ kg$$

4.7. භාගික රාශියක් ලෙස ප්‍රකාශ කර ඇති ව්‍යුත්පන්න ඒකකයක දශම ගුණාකාරයන් හා උප ගුණාකාර නම් කිරීම හරයෙහි හෝ ලවයෙහි හෝ හරයෙහි හා ලවයෙහි යොද ඇති ඒකකයන්ට වෙදයකින් තොරව උපසර්ග යෙදීමෙන් කළ හැකිය.

## V වන කොටස

මූල ඒකක පරිපූරක ඒකක සහ ව්‍යුත්පන්න ඒකක සමග භාවිතය සඳහා අනුදත් ඒකක

5.1. කාලය මැනීම සඳහා අනුදත් ඒකක.—

කාලය මැනීම සම්බන්ධයෙන් අනුදත් ඒකක.

(i) මිනිත්තුව (සංකේතය : min)

මිනිත්තුව තත්පර 60 ට සමානයි.

(ii) පැය (සංකේතය : h)

පැය තත්පර 3600 කට සමානයි.

(iii) දවස (සංකේතය : d)

දවස තත්පර 86400 කට නැතහොත් පැය 24 ට සමානයි.

(iv) ග්‍රෙගෝරි ලිතේ සඳහන් සතිය, මාසය සහ අවුරුද්ද.

5.2. තල කෝණය මැනීම සඳහා අනුදත් ඒකක.—

තල කෝණය මැනීම සම්බන්ධයෙන් අනුදත් ඒකක.

(i) පරිභ්‍රමණය (වටය)

පරිභ්‍රමණ එකක් රේඩියන් 2 $\pi$ ටසමානයි.

(ii) අංශකය (සංකේතය : °)

අංශකය රේඩියන් $\frac{\pi}{180}$ කට සමානයි.

(iii) කලා (සංකේතය : ′)

කලාව රේඩියන් $\frac{\pi}{10800}$ කට හෝ $(\frac{1}{60})°$ කට සමානයි.

(iv) විකලා (සංකේතය : ″)

විකලාව රේඩියන් $\frac{\pi}{64800}$ කට හෝ $(\frac{1}{60})'$ කට සමානයි

5.3. පරිමාව මැනීම සඳහා අනුදත් ඒකක.—

පරිමාව මැනීම සම්බන්ධ අනුදත් ඒකක.

(i) ලීටරය (සංකේතය : L හෝ l) ලීටරය ඝන මීටරයකින් දාහෙන් එ කොටසකට සමානයි.

5.4. ස්කන්ධ මැනීම සඳහා අනුදත් ඒකක.—

ස්කන්ධ හෝ බර මැනීම සම්බන්ධයෙන් අනුදත් ඒකක.

(i) මෙට්‍රික් ටොනය (සංකේතය : t) හා 'කිලෝ' 'ගිගා' 'මෙව්‍රා' යන, උපසර්ග යෙදීමෙන් සෑදෙන ගුණාකාර. මෙට්‍රික් ටොනය කිලෝග්‍රෑම් 1000 ට සමානය.

(ii) පරමාණු ස්කන්ධ ඒකකය (සංකේතය : u) පරමාණු ස්කන්ධ ඒකකය 12 නියුක්ලියඩයේ පරමාණුවේ ස්කන්ධයෙන් 1/12 භාගයකට සමානය. $1u=1.66057\times10^{-27}kg$ ආසන්න වශයෙන්) මෙය යෙදීමට අවසර ඇත්තේ රසායන විද්‍යාවේත් භෞතික විද්‍යාවේත් පමණයි .

(iii) මෙට්‍රික් ක්‍රාතය (සංකේතය : CM) මෙට්‍රික් ක්‍රාතය, කිලෝ ග්‍රෑම් 0.0002 කට සමානය. මෙය යෙදීමට අවසර ඇත් තේ මැණික් ගල්වල ස්කන්ධය දැක්වීමට පමණයි.

5.5. රෙදි පිළිවල රේඛීය ඝනත්වය මැනීම සඳහා අනුදත් ඒකක.—

රෙදිපිළිවල රේඛීය ඝනත්වය මැනීම සම්බන්ධයෙන් අනුදත් ඒකක.

(i) ටෙක්සය (සංකේතය : tex) හා පළමුවෙනි උපලේඛණයේ IV වන කොටසේ සඳහන් වන ටෙක්සයේ ගුණාකාර සහ උපගුණාකාර ටෙක්සය මීටරයට කිලෝග්‍රෑම් $10^{-6}$ කට සමානයි.

5.6. වර්ග ඵලය මැනීම සඳහා අනුදත් ඒකක.—

වර්ගඵලය මැනීම සම්බන්ධයෙන් අනුදත් ඒකක.

(i) හෙක්ටාරය (සංකේතය :ha) හෙක්ටාරය වර්ග මීටර 10000 ට සමානය මෙය යෙදීමට අවසර ඇත්තේ ඉඩම්වල වර්ගඵලය මැනීම සම්බන්ධයෙන් පමණයි.

5.7. පීඩනය මැනීම සඳහා අනුදත් ඒකක.—

පීඩනය මැනීම සම්බන්ධයෙන් අනුදත් ඒකක.

(i) බාරය (සංකේතය : bar) බාරය පැස්කල් 100000 කට සමානය. මෙය යෙදීමට අවසර ඇත්තේ තරලවල පීඩනය මැනීම සඳහා පමණයි.

(ii) සම්මත වායු ගෝලය (atm) සම්මත වායු ගෝලය යනු කිරුම් හා මිනුම් පිළිබඳ මහා සම්මේලනය විසින් නියමිත සම්මත තත්ත්වය යටතේ දී මධ්‍යයන මුහුදු මට්ටමේ දී වාතය යොදන පීඩනයයි. සම්මත වායු ගෝලය පැස්කල් 101325 කට සමානයි.

(iii) රසදිය මිලිමීටරය (සංකේතය : mm Hg) රසදිය මිලිමීටරය පැස්කල් 133.322 ක පීඩනයකට සමානය.

8. ශක්තිය, කාර්යය, තාපය මැනීම සඳහා අනුදත් ඒකක.—

ශක්තිය, කාර්යය හා තාප ප්‍රමාණය මැනීම සම්බන්ධයෙන් අනුදත් ඒකක.

(i) ඉලෙක්ට්‍රෝන් වෝල්ටය (සංකේතය eV) ඉලෙක්ට්‍රෝන් වෝල්ටය යනු රික්තයේදී එක් වෝල්ටයක විභව අන්තරයක් හරහා යැමේ දී ඉලෙක්ට්‍රෝනයක් ලබා ගන්නා ශක්තියයි. $1eV = 1.6021\ 9 \times 10^{-19}$ J (ආසන්න වශයෙන්)

(ii) වොට් පැය (සංකේතය : Wh)

වොට් පැය, ජූල් $3.6 \times 10^3$ කට සමානයි.

9. උෂ්ණත්වය මැනීම සඳහා අනුදත් ඒකක.—

උෂ්ණත්වය මැනීම සම්බන්ධයෙන් අනුදත් ඒකක.

(i) අංශක සෙල්සියස් (සංකේතය : °C) අංශක සෙල්සියස් යනු තාපගතික උෂ්ණත්ව පරිමානයට අනුව ශුන්‍ය උෂ්ණත්වය 273.15 K වන අන්තර්ජාතික උෂ්ණත්ව පරිමානයයි.

සෙල්සියස් අංශකය = කෙල්වින් අංශකය

## දෙවන උප ලේඛනය

I වන කොටස

(1) යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ පමණක් පහත සඳහන් මිනුම් ඒකක භාවිතයට ගත හැකි වේ.

1.1. දිග මැනීම. —

අඟල (සංකේතය in නැතහොත් ")

අඟල හරියටම මීටර 0.0254 කට සමානය.

1.2. ස්කන්ධය මැනීම. —

රාත්තල (සංකේතය : lb)

රාත්තල හරියටම කිලෝ ග්‍රෑම් 0.453 54237 කට සමානය.

II වන කොටස

(2) නාවික හා ගුවන් ක්ෂේත්‍රවලදී පමණක් පහත සඳහන් මිනුම් ඒකක භාවිතයට ගත හැකි වේ.

2.1. දිග නැතහොත් දුර මැනීම.

නාවික සැතපුම

නාවික සැතපුම, මීටර 1852 ක දුරකට සමානය.

2.2. වේගය මැනීම.

නොට්

නොට් ඒකක වේගය, පැයට නාවික සැතපුමක වේගයට සමාන වේගයයි.

## තුන්වන උප ලේඛනය

I වන කොටස

වෙළෙඳාම සඳහා මිනුම් ඒකක.

1.1. දිග මැනීම

කිලෝ මීටරය (සංකේතය : km) = 1000 m

මීටරය (සංකේතය : m)

ඩෙසි මීටරය (සංකේතය : dm) = $\frac{1}{10}$ m

සෙන්ටි මීටරය (සංකේතය : cm) = $\frac{1}{100}$ m

මිලි මීටරය (සංකේතය : mm) = $\frac{1}{1000}$ m

මයික්‍රෝ මීටරය (සංකේතය : μm) = $\frac{1}{1000\ 000}$ m

1.2 වර්ගඵල මැනීම

වර්ග කිලෝ මීටරය (සංකේතය : $km^2$) = 1000 000 $m^2$

වර්ග මීටරය (සංකේතය : $m^2$)

වර්ග ඩෙසි මීටරය (සංකේතය : $dm^2$) = $\frac{1}{100}$ $m^2$

වර්ග සෙන්ටි මීටරය (සංකේතය : $cm^2$) = $\frac{1}{10\ 000}$ $m^2$

වර්ග මිලි මීටරය (සංකේතය : $mm^2$) = $\frac{1}{1000\ 000}$ $m^2$

හෙක්ටාරය (සංකේතය : ha) = 10 000 $m^2$

1.3. පරිමාව නැතහොත් ධාරිතාවය මැනීම

ඝන මීටරය (සංකේතය : $m^3$)

ඝන ඩෙසි මීටරය (සංකේතය : $dm^3$) = $\frac{1}{1000}$ $m^3$

ඝන සෙන්ටි මීටරය (සංකේතය : $cm^3$) = $\frac{1}{1000\ 000}$ $m^3$

ඝන මිලි මීටරය (සංකේතය : $mm^3$) = $\frac{1}{1000\ 000\ 000}$ $m^3$

හෙක්ටෝ ලීටරය (සංකේතය : hl) = $\frac{1}{20}$ $m^3$
(නැතහොත් hL)

ලීටරය (සංකේතය : L) = $\frac{1}{1000}$ $m^3$
(නැතහොත් )

ඩෙසි ලීටරය (සංකේතය : dl) = $\frac{1}{10\ 000}$ $m^3$
(නැතහොත් dL)

සෙන්ටි ලීටරය (සංකේතය : cL) $= \frac{1}{100\ 000} m^3$

මිලි ලීටරය (සංකේතය : mL) $= \frac{1}{1000\ 000} m^3$

1.4. ස්කන්ධය නැතහොත් බර මැනීම.

මෙට්‍රික් ටොන් (සංකේතය : t) = 1000 kg

කිලෝ ග්‍රෑම (සංකේතය : kg)

ග්‍රෑම (සංකේතය : g) $= \frac{1}{1000}$ kg

මිලි ග්‍රෑම (සංකේතය : mg) $= \frac{1}{1000\ 000}$ kg

මයික්‍රෝ ග්‍රෑම (සංකේතය : g) $= \frac{1}{1000\ 000\ 000}$ kg

මෙට්‍රික් ක්‍රාතය (සංකේතය CM) $= \frac{1}{5000}$ kg

1.5. ඝනත්වය මැනීම.

ඝන මීටරයට ටොන් (සංකේතය : $t/m^3$) = 1000 $kg/m^3$
(නැතහොත් $t.m^{-3}$)

ලීටරයට කිලෝග්‍රෑම (සංකේතය : kg/L) = 1000 $kg/m^3$
(නැතහොත් $kg.\ L^{-1}$)

ඝන මීටරයට කිලෝග්‍රෑම (සංකේතය : $kg/m^3$)
(නැතහොත් $kg.m^{-3}$)

මිලි ලීටරයට ග්‍රෑම (සංකේතය : g/mL) = 1000 $kg/m^3$
(නැතහොත් $g.mL^{-1}$)

ලීටරයට ග්‍රෑම (සංකේතය : g/L) = $kg/m^3$
(නැතහොත් $g.L^{-1}$)

1.6. රෙදිපිළිවල රේඛීය ඝනත්වය මැනීම.

කිලෝ මීටරයට මිලි ග්‍රෑම (සංකේතය : mg/km) = මිලි ටෙක්ස් (සංකේතය ; mtex)

කිලෝ මීටරයට ඩෙසි ග්‍රෑම (සංකේතය ; d g/km) = ඩෙසි ටෙක්ස් (සංකේතය :dtex) = 100 mg/km

කිලෝ මීටරයට ග්‍රෑම (සංකේතය ; g/km) = ටෙක්ස් (සංකේතය ; tex)
g/

කිලෝ මීටරයට කිලෝග්‍රෑම (සංකේතය : kg/km) = කිලෝ ටෙක්ස් (සංකේතය ; ktex)

1.7 පීඩනය මැනීම :

මෙගා පැස්කල් (සංකේතය : MPa) = 1000 000 Pa

කිලෝ පැස්කල් (සංකේතය : kPa) = 1000 Pa

පැස්කල් (සංකේතය Pa)

1.8. කාලය මැනීම.—

අවුරුද්ද

මාසය

සතිය

දවස (සංකේතය : d) = 86 400 s

පැය (සංකේතය : h) = 3600 s

මිනිත්තුව (සංකේතය : min) = 60s

තත්පරය (සංකේතය : s)

මිලි තත්පරය (සංකේතය ms) = $\frac{1}{1000}$ s

මයික්‍රෝ තත්පරය (සංකේතය : µs) = $\frac{1}{1000\ 000}$ s

නැනෝ තත්පරය (සංකේතය : ns) = $\frac{1\ s}{1000\ 000\ 000}$

1.9. තල කෝණ මැනීම.—

රේඩියනය (සංකේතය : rad )

අංශකය (සංකේතය : ° ) = $\frac{\pi}{180}$ rad

කලා (සංකේතය : ...′ ) = $\frac{\pi}{10\ 800}$ rad

විකලා (සංකේතය : ...″ ) = $\frac{\pi}{648\ 000}$ rad

1.10. ඝන කෝණ මැනීම.—

ස්ටෙරේඩියනය (සංකේතය : sr )

1.11. වේගය මැනීම.—

පැයට කිලෝ මීටර (සංකේතය : km/h ) = $\frac{10}{36}$ m/s

තත්පරයට මීටර (සංකේතය : m/s )

1.12. ත්වරණය මැනීම.—

වර්ග තත්පරයට මීටර (සංකේතය : $m/s^2$ )

1.13. කෝණික ප්‍රවේගය මැනීම.—

තත්පරයට රේඩියන් (සංකේතය : rad/s )

1.14. කෝණික ත්වරණය.—

වර්ග තත්පරයට රේඩියන් (සංකේතය : $rad/s^2$ )

1.15. සංඛ්‍යාතය මැනීම.—

ගිගා හර්ට්සය (සංකේතය : GHz ) = 1000 000 000 Hz
මෙගා හර්ට්සය (සංකේතය : MHz ) = 1000 000 Hz
කිලෝ හර්ට්සය (සංකේතය : kHz ) = 1000 Hz

හර්ට්සය (සංකේතය : Hz )

මිලි හර්ට්සය (සංකේතය : mHz ) = $\frac{1}{1000}$ Hz

1.16. බලය මැනීම.—

මෙගා නිව්ටනය (සංකේතය : MN ) = 1000 000 N
කිලෝ නිව්ටනය (සංකේතය : kN ) = 1000 N
නිව්ටනය (සංකේතය : N )

1.17. දුස්සාවීතාවය මැනීම.—

ගතික දුස්සාවීතාව — පැස්කල් තත්පර (සංකේතය : Pa.s )
ප්‍රගති දුස්සාවීතාව — තත්පරයට වර්ග මීටර (සංකේතය : $m^2/s$)

1.18. උෂ්ණත්වය මැනීම.—

කෙල්වින් (සංකේතය : K )
සෙල්සියස් අංශක (සංකේතය : °C ) = 1K

1.19. කාර්ය ප්‍රමාණය, ශක්තිය සහ තාප ප්‍රමාණය මැනීම.—

කිලෝ ජූල් (සංකේතය : kJ ) = 1000 J
ජූල් (සංකේතය : J )
කිලෝ වොට් පැය (සංකේතය : kWh ) = 36 000 00 J

1.20. ජවය, ශක්තිය ගැලීමේ සීඝ්‍රතාව, තාපය ගැලීමේ සීඝ්‍රතාවය මැනීමේ ඒකකය.—

මෙගා වොට් (සංකේතය : MW ) = 1000 000 W
කිලෝ වොට් (සංකේතය : kW ) = 1000 W
වොට් (සංකේතය : W )
මිලි වොට් (සංකේතය : mW ) = $\frac{1}{1000}$ W

1.21. තාප ධාරිතාව මැනීම.—

කෙල්විනයට කිලෝ ජූල් (සංකේතය : kJ/K ) = 1000 J/K
කෙල්විනයට ජූල් (සංකේතය : J/K )

1.22. විශිෂ්ට ශක්තිය (ස්කන්ධය මුල් කරගත් කැලරි අගය) මැනීම.—

කිලෝ ග්‍රෑමයට කිලෝ ජූල් (සංකේතය : kJ/kg ) = 1000 J/kg
කිලෝ ග්‍රෑමයට ජූල් (සංකේතය : J/kg )
ග්‍රෑමයට ජූල් (සංකේතය : J/g ) = 1000 J/kg

1.23. විශිෂ්ට ශක්තිය (පරිමාව මුල් කරගත් කැලරි අගය) මැනීම.—

ඝන මීටරයකට කිලෝ ජූල් (සංකේතය : $kJ/m^3$ ) = 1000 $J/m^3$
ලීටරයට කිලෝ ජූල් (සංකේතය : kJ/L ) = 100 090 J/m

1.24. විද්‍යුත් ධාරාව මැනීම.—

ඇම්පියරය (සංකේතය : A )

මිලි ඇම්පියරය (සංකේතය : mA ) = $\frac{1}{1000}$

මයික්‍රෝ ඇම්පියරය (සංකේතය : µA ) = $\frac{1}{1000\,000}$ A

1.25. විද්‍යුත් ගාමක බලය සහ විභව අන්තරය මැනීම.—

කිලෝ වෝල්ට් (සංකේතය : kV ) = 1000 V

වෝල්ට් (සංකේතය : V )

මිලි වෝල්ට් (සංකේතය : mV ) = $\frac{1}{1000}$ V

මයික්‍රෝ වෝල්ට් (සංකේතය : µV ) = $\frac{1}{1000\,000}$ V

1.26. විද්‍යුත් ධාරිතාව මැනීම.—

ෆැරඩය (සංකේතය : F)

මයික්‍රෝ ෆැරඩ (සංකේතය µF = $\frac{1}{1000\,000}$ F

පිකෝ ෆැරඩ (සංකේතය : pF ) = $\frac{1}{1000\,000\,000\,000}$ F

1.27. විද්‍යුත් ප්‍රේරතාව මැනීම.—

හෙන්රි (සංකේතය : H)

මිලි හෙන්රි (සංකේතය : mH) = $\frac{1}{1000}$ H

මයික්‍රෝ හෙන්රි (සංකේතය : µH ) = $\frac{1}{1000\,000}$ H

1.28. විද්‍යුත් ප්‍රතිරෝධය මැනීම.—

මෙගා ඕම් (සංකේතය :MΩ) = 1000 000Ω

කිලෝ ඕම් (සංකේතය : kΩ) = 1000Ω

ඕම් (සංකේතය : Ω )

මිලි ඕම් (සංකේතය : mΩ) = $\frac{1}{1000}$ Ω

මයික්‍රෝ ඕම් (සංකේතය : µΩ) = $\frac{1}{1000\,000}$ Ω

1.29. විද්‍යුත් ආරෝපණ ප්‍රමාණය මැනීම.—

ඇම්පියර් පැය (සංකේතය : Ah) = 3600C

කූලෝමය (සංකේතය : C)

මයික්‍රෝ කූලෝමය (සංකේතය : µC) = $\frac{1}{1\,000\,000}$ C

1.30. දීප්ත තීව්‍රතාව මැනීම.—

කැන්ඩෙලා (සංකේතය : cd )

1.31. ප්‍රදීපන තීව්‍රතාවය.—

ලක්ස් (සංකේතය : lx )

1.32. දීප්ත ස්‍රාව ප්‍රමාණය මැනීම

ලුමනය (සංකේතය : lm )

2 කොටස

තවර හෝ වෙළෙඳාමකදී භාවිත කිරීමට අනුමත පඩි හා මිනුම්

1. දිග මිනුම්

මීටර — 100

මීටර — 50

මීටර — 30

මීටර — 20

මීටර — 10

මීටර — 5

මීටර — 2

මීටර — 1

සෙන්ටි මීටර 50

ඩෙසි මීටර 1

සෙන්ටි මීටර 1

මිලි මීටර 1

මයික්‍රෝ මීටර 1 යනාදී මිනුම්.

2. වර්ග ඵල මිනුම්

වර්ග ඩෙසි මීටරය හෝ එහි ඊනැම ගුණාකාරයකින් යුත් මිනුම්.

3. (අ) පරිමා මිනුම්.

ඝන ඩෙසි මීටරය $=0.001\ m^3$ යේ මිනුම හෝ එහි ඊනැම ගුණාකාරයකින් යුත් මිනුම්.

(ආ) ධාරිතා මිනුම්—ද්‍රව.

ලීටර 10 හෝ ලීටර 10 යේ ඊනැම ගුණාකාරයකින් යුත් මිනුම්.

ලීටර 5

ලීටර 2

ලීටර 1

මිලි ලීටර 500

මිලි ලීටර 200

මිලි ලීටර 100

මිලි ලීටර 50

මිලි ලීටර 20

මිලි ලීටර 10

මිලි ලීටර 5

මිලි ලීටර 2

මිලි ලීටර 1 යනාදී මිනුම්

4. පඩි.

| (අ) | (ආ) |
|---|---|
| කිලෝ ග්‍රෑම 50 | මෙට්‍රික් කැරට් 500 |
| කිලෝ ග්‍රෑම 20 | මෙට්‍රික් කැරට් 200 |
| කිලෝ ග්‍රෑම 10 | මෙට්‍රික් කැරට් 100 |
| කිලෝ ග්‍රෑම 5 | මෙට්‍රික් කැරට් 50 |
| කිලෝ ග්‍රෑම 2 | මෙට්‍රික් කැරට් 20 |
| කිලෝ ග්‍රෑම 1 | මෙට්‍රික් කැරට් 10 |
| ග්‍රෑම 500 | මෙට්‍රික් කැරට් 5 |
| ග්‍රෑම 200 | මෙට්‍රික් කැරට් 2 |
| ග්‍රෑම 100 | මෙට්‍රික් කැරට් 1 |
| ග්‍රෑම 50 | මෙට්‍රික් කැරට් 0.5 |
| ග්‍රෑම 20 | මෙට්‍රික් කැරට් 0.2 |
| ග්‍රෑම 10 | මෙට්‍රික් කැරට් 0.1 |
| ග්‍රෑම 5 | මෙට්‍රික් කැරට් 0.05 |
| ග්‍රෑම 2 | මෙට්‍රික් කැරට් 0.02 |
| ග්‍රෑම 1 | මෙට්‍රික් කැරට් 0.01 |
| මිලි ග්‍රෑම 500 | |
| මිලි ග්‍රෑම 200 | |
| මිලි ග්‍රෑම 100 | |
| මිලි ග්‍රෑම 50 | |
| මිලි ග්‍රෑම 20 | |
| මිලි ග්‍රෑම 10 | |
| මිලි ග්‍රෑම 5 | |
| මිලි ග්‍රෑම 2 | |
| මිලි ග්‍රෑම 1 | |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 870 කි. (විදේශීය රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය. ලෝටස් පාර. කොළඹ 01. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.